# දිව්‍යාවදානයේ මාකන්දිකාවදානය

## අන්තර්ගතය - ආකෘතිය - රචනා ශෛලිය හා අන්තර් මූලාශ්‍රයීය විමර්ශනයක්*

වැලිපිටියේ ඉන්දානන්ද හිමි

*Mākandikāvadāna* is the thirty-sixth *Avadāna* in the *Divyāvadāna*, one of the significant works in the Sanskrit *Avadāna* literature. Mākandika, a prominent mendicant (*parivrājaka*), lived in the period of the Buddha, is one of the protagonists in the *Avadāna* and therefore, it can be assumed that the story has been nominated under his name. It seems that even though the studies on the *Divyāvadāna* have been discussed in the *Mākandikāvadāna* generally, it is difficult to find out specific studies on it that review the content, structural features, style of writing, and the combination with other sources written both in Sanskrit and Pali. Therefore, the main purpose of this article is to review the *Mākandikāvadāna* focusing on the aforementioned aspects. Among the existing studies of the *Divyāvadāna,* the English translation of Andy Rotman (Divine Stories – Part I and II), the edition of the *Divyāvadāna* done by P L Vaidya, the Sinhalese translation of Venerable Akuretiye Amarawansa Thera and the article written by Sathishi Hiraoka (The Relationship between the *Divyāvadāna* and the *Mūlasarvāstivāda Vinaya*) were mainly referred except the other relevant sources written in Pali and Sanskrit. By considering the limitations of the study, the aspects of the *Mākandikāvadāna* which are discussed here mainly depend on the *Mākandikāvadāna* and they are not compared with other *Avadānas* in the *Divyāvadāna.* The article is written in Sinhala medium to cater to the individuals

who are interested in Sanskrit *Avadāna* literature but there are some difficulties to read the original texts written in Sanskrit.

## 01. හැඳින්වීම

සංස්කෘත අවදාන සාහිත්‍යයට අයත් මූලාශ්‍රයයන් අතර වැදගත් භූමිකාවකට හිමිකම් කියන දිව්‍යාවදානයේ තිස්හය වැනි අවදානය 'මාකන්දිකාවදාන'යයි. මාකන්දික නමැති පිරිවැජියා මුල් කරගත් කථා ප්‍රවෘත්තියක් මෙහි ඇතුළත් හෙයින් එනමින්ම මෙම අවදානය නම් කර ඇතැයි සිතිය හැකිය. අනෙකුත් අවදාන මෙන් මෙයද බුද්ධ දේශනාවක ස්වරූපයෙන් දිගහැරේ. මෙම ශාස්ත්‍රීය ලේඛනයේදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු වන්නේ උක්ත අවදානයේ අන්තර්ගතය, ආකෘතික ලක්ෂණ, රචනා ශෛලිය හා වෙනත් සංස්කෘත හා පාලි මූලාශ්‍රයන් සමග මෙම අවදානය සම්බන්ධ වන ආකාරය යන ක්ෂේත්‍ර පිළිබඳ විමසා බැලීමටයි. අවදාන සාහිත්‍යය පිළිබඳවත් දිව්‍යාවදානය පිළිබඳවත් පොදුවේ විමසා බැලෙන ශාස්ත්‍රීය ලේඛන පැවතියද මාකන්දිකාවදානය පිළිබඳ පමණක් සිදු වූ හුදෙකලා විමර්ශන සිංහල මාධ්‍යයෙන් හමුවේදැයි සැක සහිතය. තවද, බෞද්ධ සාහිත්‍යයේ ඇතුළත් කතා පුවතක් ඒ පිළිබඳ සඳහන් වන විවිධ මූලාශ්‍රය භාවිත කරමින් සංසන්දනාත්මකව විමසා බැලීම මෙහිලා වැදගත් අනාවරණයන්ට මුල් වේ. මේ වන විට ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම මගින් පවත්වනු ලබන ප්‍රාචීන පණ්ඩිත මධ්‍යම විභාගයේ විෂය නිර්දේශයට අයත් දිව්‍යාවදානයේ අවදාන කථා හතර අතර මාකන්දිකාවදානයද එකකි. අකුරැටියේ අමරවංස නාහිමියන් විසින් කළ දිව්‍යාවදානයේ සිංහල අනුවාදයට අමතරව මේ සම්බන්ධයෙන් අධ්‍යයන සුලභ වීම අත්‍යවශ්‍ය කාරණයකි. එය විශේෂයෙන්ම සිංහල මාධ්‍යයෙන් මේ පිළිබඳ හදාරන්නන් හට දිරි දීමකි. අධ්‍යයනයේ පහසුව සලකා එක් අවදානයකට පමණක් මෙහිදී සීමා වන අතර PL Vaidya ගේ දිව්‍යාවදාන සංස්කරණය මූලාශ්‍රය වශයෙන් භාවිත කරනු ලැබේ.

## 02. මාකන්දිකාවදානයේ අන්තර්ගතය

මෙම කතාපුවතෙහි එන ප්‍රධාන සිදුවීම බුදුරදුන් කුරු රටේ සංචාරය කරන අවස්ථාවක කල්මාෂදම්‍ය නම් ස්ථානයක වැඩසිටියදී සිදු වූවක් බව අවදානය ආරම්භයේදීම දැනගත හැකිය.[1] අනුපමා නමැති සිය රූපවත් දියණියට සුදුසු ස්වාමියෙකු පිළිබඳ සිතමින් සිටි මාකන්දික පිරිවැජියා බුදුරජ දුටු විට සිතන්නේ සිය අරමුණ සඵල වූ බවයි. වහාම නිවසට ගිය හෙතෙම සිය බිරිඳ සාකලි මේ පිළිබඳ දැනුවත් කර දියණියද සරසාගෙන බුදුරජ වෙතට පැමිණෙයි. අතරමගදී සාකලි විවිධ හේතු දක්වමින් මෙයට විරුද්ධ වුවත් ඒවා නොසැලකූ මාකන්දික බිරිඳ සහ දියණිය රැගෙන බුදුන් වෙතට ගොස් සිය අරමුණ බුදුරදුන්ට දන්වා සිටී. එහෙත් කරුණු පැහැදිලි කරමින් මාකන්දිකගේ අදහස ප්‍රතික්ෂේප කරන බුදුරදුන් සිය වීතරාගීත්වය පැහැදිලි කරමින් 'මූත්‍රපුරීෂ' පිරුණු අනුපමාව ප්‍රතික්ෂේප කරයි. අනතුරුව එහි සිටි එක්තරා මහලු භික්ෂුවක් බුදුරදුන්ගෙන් ඉල්ලා සිටින්නේ 'අනුපමා ඔබට අනවශ්‍ය නම් මා හට ලබාදෙන ලෙස'යි. බුදුරදුන් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ කල්හි එම මහලු

භික්ෂුව ශික්ෂාව ප්‍රතික්ෂේප කර මාකන්දික වෙත ගොස් අනුපමා තමන්ට ලබාදෙන ලෙස ඉල්ලා සිටින අතර මාකන්දික එම මහල්ලා පලවාහරී. බුදුරදුන් විසින් අනුපමා ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ පුවත සාකච්ඡා කරමින් සිටි භික්ෂූන්ට තමන් වහන්සේ මීට පෙරදීත් අනුපමා ප්‍රතික්ෂේප කළ බව සනාථ කිරීමට බුදුන් වහන්සේ අතීත කථාවක් ගෙනහැර දක්වති. එය මෙම අවදානයේදී හමුවන පළමු අතුරු කථාවයි.

එම අතුරු කථාව අවසන් වූ පසු නැවතත් භික්ෂූන් බුදුරදුන්ගෙන් විමසන්නේ අනුපමා පිළිබඳ අපේක්ෂාවෙන් විනාශ වූ මහලු භික්ෂුව පිළිබඳවයි. අනතුරුව, අතීත භවයකදීද අනුපමා හේතුවෙන් එම මහල්ලා විනාශ වූ අයුරු පැහැදිලි කිරීමට දෙවැනි අතුරු කථාව/අතීත කථාව ගෙනහැර දක්වන අතර එය තරමක් දීර්ඝ වූවකි. ඉන් අනතුරුව නැවතත් ප්‍රධාන කථාවට ප්‍රවේශ වේ. මාකන්දික සිය දියණිය සමග කෞශාම්බියට යන අතර එහිදී උදයන රජු අනුපමා සිය අන්තඃපුරයට තෝරාගනී; මාකන්දිකට අග්‍රාමාත්‍ය තනතුරක් පිරිනමයි. මේ අතර බුදුන් සරණ ගිය තැනැත්තියක වන ශ්‍යාමාවතී නමැති අගබිසව කෙරෙහි අනුපමා ඊර්ෂ්‍යාවෙන් පසුවන අතර[2] රජු ඇය කෙරෙහි බිඳවීමට නොයෙක් උපක්‍රම යොදයි. අනුපමාගේ කපටි ප්‍රයෝගවල ඵලයක් වශයෙන් අවසානයේදී ශ්‍යාමාවතී කෙරෙහි කිපුණු රජු ඇය නැසීමට සූදානම් වුවද එයද නිෂ්ඵල වූ අතර එතැන් පටන් රජු පෙරටත් වඩා ශ්‍යාමාවතී කෙරෙහි සෙනෙහෙබර වෙයි. මේ අතර ප්‍රත්‍යන්ත ප්‍රදේශයක හටගත් කැරැල්ලක් සමනය කිරීමට රජු සේනාව සමග පිටත් වන අතර ශ්‍යාමාවතීගේ අවශ්‍යතා පිළිබඳ සොයාබැලීම ඇතුළු රජවාසලේ සියලු කටයුතු පැවරෙන්නේ මාකන්දික අගමැතිතුමාටය. මෙම අවස්ථාව මැනවින් ප්‍රයෝජනයට ගත් අනුපමා බිසව සිය පියාට බලපෑම් කර ඔහු සමග එක්ව කුමන්ත්‍රණය කර ශ්‍යාමාවතී ඇතුළු පන්සියයක් කාන්තාවන් සිටි ප්‍රාසාදයට ගිනි තබා ඒ සියලු දෙනා ඝාතනය කරයි. ගින්න නිවීමට පුරවැසියන් සූදානම් වුවද මාකන්දික එයට ඉඩ නොදෙයි. කෙසේ හෝ කුබ්ජෝත්තරා පමණක් දිවි බේරාගනී. පසුව මෙම අවාසනාවන්ත සිදුවීම පිළිබඳ ඇමතිවරුන් විසින් උපක්‍රමශීලීව රජුට දන්වනු ලැබේ. වහාම මාලිගාවට පැමිණි රජු ශ්‍යාමාවතීගේ වියෝවෙන් දළ සොවින් තැවෙන්නේ මාකන්දික - අනුපමා දෙපල යන්ත්‍රගෘහයේ[3] දමා දවන ලෙස යෝගන්ධරායණ අගමැතිවරයාට නියෝග කරයි. එහෙත් යෝගන්ධරායණ විසින් එම දෙදෙනා භූමිගෘහයේ[4] සඟවන අතර දින හතක් ඇවෑමෙන් ශෝකය පහවූ රජු නැවතත් අනුපමා පිළිබඳ යෝගන්ධරායණගෙන් විමසන අතර එවිට යෝගන්ධරායණ විසින් අනුපමා රජු වෙත පමුණුවනු ලැබේ. අනතුරුව බුදුරදුන් වෙත එළඹි උදයන රජු ශ්‍යාමාවතී ප්‍රමුඛ පන්සියයක් පිරිස ගින්නෙන් දැවී යාමට හේතු වූ, ඔවුන් විසින් කළ පූර්ව කර්මය කුමක්දැයි විමසන අතර බුදුරදුන් ඊට අදාළ අතීත කථාව ගෙනහැර දක්වයි. කුබ්ජෝත්තරාගේ ජීවිතය පමණක් බේරීමට හේතුව එම කථාවේ ඇතුළත් වේ.

මෙම අතීත කථාවෙන් අනතුරුව භික්ෂූන් විසින් බුදුරදුන්ගෙන් විමසන්නේ පිළිවෙළින්, 1). කුබ්ජෝත්තරා කුදු වීමටත් 2). ඇය ශ්‍රුතධර තැනැත්තියක වීමටත් 3). දාසියකව ඉපදීමටත් හේතු වූ පූර්ව කර්ම පිළිබඳවයි. බුදුරදුන් ඒවාට අදාළ පූර්ව කර්ම පැහැදිලි කළ අතර ඉන් අනතුරුව භික්ෂූන්ගේ විමසීමට ප්‍රතිචාර වශයෙන්

බුදුරදුන් පැහැදිලි කරන්නේ නිරාහාරව දින හතක් භූමිගෘහයේ සිටියත් නොමැලවුණු ශරීරයකින් යුක්ත වූ අනුපමා එබඳු ඵලයක් ලැබීමට බලපෑ පූර්ව කර්මය පැහැදිලි කෙරෙන අතීත කථාවයි. කෙසේ වෙතත් එම අතීත කථාවේ විශේෂත්වයක් දක්නට ලැබේ. එනම්, අනුපමාගේ පූර්ව කර්මය පිළිබඳ ඉතාම කෙටියෙන් දක්වා ඉන් අනතුරුව එම භවයේ ඇගේ යෙහෙළිය වූ, මෙකල සෝෂිල ගෘහපතිගේ දියණිය වූ ශ්‍රීමතී සම්බන්ධ ප්‍රවෘත්තියක් ගෙනහැර දැක්වීමයි. එම කොටස එතෙක් පවසන ලද මාකන්දිකාවදානයට අන්තර්ගතය අතින් හෝ ගලායාම අතින් හෝ කිසිදු සම්බන්ධයක් නොමැතිය (මේ පිළිබඳ ඉදිරියේදී වැඩි දුර සාකච්ඡා කෙරේ.). මෙම අවදානය අවසන් කර ඇති ආකාරයද වෙනස් ස්වරූපයක් ගනී.[5]

### 03. මාකන්දිකාවදානයේ ඇතුළත් 'අතීත කථා'

එක් අවදානයක් තුළ විවිධ අතීත කථා ගණනාවක් ඇතුළත් වීම අවදානවල සාමාන්‍ය ස්වභාවයයි. එම අතීත කථා බොහෝ දුරට අවදාන කථාවේ චරිතවල අතීත කර්ම ප්‍රකට කරයි. මෙම අතීත කථා ශෛලිය මාකන්දිකාවදානයේද ඇතුළත් වන අතර එහි ඇතුළත් අතීත කථා හත ප්‍රධාන කොටස් දෙකකට වර්ග කළ හැකිය.

1. අවදානයේදී හමු වන චරිතයක් වර්තමානයේ අත්විඳින හොඳ හෝ නරක ඵලයකට අදාළ අතීත කර්ම පැහැදිලි කෙරෙන කථා
2. කිසියම් චරිතයක වර්තමානයේ පවතින ලක්ෂණ / ස්වභාවයන් / අත්දැකීම් අතීතයේද පැවැති බව තහවුරු කිරීමේ අරමුණෙන් ප්‍රකාශිත කථා යනුවෙනි.

මෙම දෙවර්ගයටම අයත් කථා බුද්ධ භාෂිත වශයෙන් ඉදිරිපත් කර තිබේ.

මාකන්දිකාවදානයේ උක්ත ප්‍රථම වර්ගීකරණයට අයත් කථා පහක් ඇතුළත් වන අතර ඒවා ප්‍රධාන කථාවේ සඳහන් වන අනුපිළිවෙළට පහත දක්වනු ලැබේ.

1. ශ්‍යාමාවතී ඇතුළු පන්සියයක් ස්ත්‍රීන් ගින්නෙන් විනාශ වීමට බලපෑ හේතුව පැහැදිලි කෙරෙන කථාව
2. කුබ්ජෝත්තරාගේ කුදු බවට හේතු වූ පූර්ව කර්මය පැහැදිලි කෙරෙන කථාව
3. ශ්‍රුතධර තැනැත්තියක වීමට කුබ්ජෝත්තරා පෙර කළ පින පිළිබඳ පැහැදිලි කෙරෙන අතීත කථාව
4. කුබ්ජෝත්තරා දාසියක වීමට හේතුව පැහැදිලි කෙරෙන අතීත කථාව
5. සතියක් පුරා භූමි ගෘහයේ සඟවා සිටියත් කිසිදු වෙනසක් නොමැතිව සිටි අනුපමා එවැනි ඵලයක් ලැබීමට පෙර කළ පින පැහැදිලි කෙරෙන අතීත කථාව යනුවෙනි. පෙර දැක්වූ ප්‍රධාන වර්ගීකරණ දෙක අතරින් දෙවැනි වර්ගයට අයත් කථා දෙකක් ප්‍රස්තුත අවදානයේදී හමුවේ. එනම්,

    1. බුදුරදුන් විසින් වර්තමාන භවයේදී පමණක් නොව, පෙර භවයකදීද අනුපමා ප්‍රතික්ෂේප කළ බව පැහැදිලි කරන අතීත කථාව

2. මහල්ලක වර්තමාන භවයේදී පමණක් නොව, පෙර භවයකදීද අනුපමා හේතුවෙන් විපතට පත් වූ බව පැහැදිලි කෙරෙන කථාව යනුවෙනි.

පෙර දැක්වූ පළමු වර්ගයේ කථා පහ දෙවැනි වර්ගයේ කථා දෙකට සාපේක්ෂව කෙටි වීම කැපී පෙනෙන ලක්ෂණයකි. එසේම, එම කථා පහේ සැකැස්ම හා ප්‍රමාණය පිළිබඳ සලකා එම කථා පහ කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. එනම්,

1. කථාවක් වශයෙන් අනුපිළිවෙළ සිදුවීම් ගළපා ඉදිරිපත් කර ඇති කථා

2. ඉතා සීමිත වාක්‍ය කිහිපයකින් යුක්ත කථා යනුවෙනි.

ඉහත ප්‍රථම වර්ගීකරණයේ පළමු, දෙවැනි හා පස්වැනි කථා අනුපිළිවෙළ සිදුවීම් ගළපා, එනම් නිශ්චිත ආරම්භයක්, සංසිද්ධි පැහැදිලි කෙරෙන අන්තර්ගතයක් හා සමෝධානයක් සහිතව ඉදිරිපත් කර ඇති අතර තෙවන හා සිව්වන කථා වාක්‍ය කිහිපයකට සීමා වේ. එහි ශෛලිය වන්නේ කිසියම් විද්‍යමාන තත්ත්වයකට හේතු වූ අතීත කර්මය පමණක් සඳහන් වීමයි. එයට හේතු වශයෙන් හඳුනාගත හැක්කේ කුබ්ජෝත්තරාගේ කුදු බවට හේතු වූ පූර්ව කර්මය පැහැදිලි කෙරෙන දෙවැනි කථාවට අනතුරුව ඇති කථා දෙකම කුබ්ජෝත්තරා කුදු බවට පත් වූ භවයේම සිදු වූ සිදුවීම් සම්බන්ධ කථා වන හෙයින් මූලික විස්තර නැවත සඳහන් නොකර අදාළ සිදුවීම පමණක් සැකෙවින් දක්වා තිබීමයි.

මෙකී කථා ප්‍රධාන කථාවට සම්බන්ධ කර තිබෙන ආකාරයද විමසා බැලිය යුතුය. එහි ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකිය.

- කිසියම් සිදුවීමකට අනතුරුව භික්ෂූහු හෝ වෙනත් අයෙක් ඒ පිළිබඳ බුදුරදුන්ගෙන් විමසති. එවිට බුදුරදුන් 'මහණෙනි, මෙකල පමණක් නොවේ. අතීතයේත් මෙසේ වූයේය.' යනුවෙන් පවසා අතීත කථාවක් ගෙනහැර දක්වයි.

- අතීත කථාවක් ආරම්භ කරන්නේ 'භූතපූර්වං' යනුවෙනි. එහෙත් එක් චරිතයක එකම භවයක සිදුවීම් කිහිපයක් දැක්වීමේදී මෙම ලක්ෂණය අවිද්‍යමාන අතර වර්තමාන ඵලයට සම්බන්ධ අතීත කර්මය පමණක් සඳහන් කරයි. කුබ්ජෝත්තරා සම්බන්ධ දෙවැනි හා තෙවැනි කථා මෙනි.

- කථාව අවසානයේ පූර්වාපර සන්ධි ගළපයි. එහෙත් ඇතැම් කථාවලදී පූර්වාපර සන්ධි ගැළපීමෙන් නොනවතින ආකාරයද දක්නට ලැබේ. උදාහරණයක් වශයෙන් ශ්‍යාමාවතී ගින්නෙන් මියැදීමට අදාළ පූර්ව කර්මය පැහැදිලි කර ඉන් නොනැවතී කර්මය පිළිඳ බුදුරදුන්ගේ කෙටි අනුශාසනාවක්ද ඇතුළත් කරයි.

- මීට අමතරව, අනුපමා විසින් පෙර කරන ලද කුශල කර්මය පිළිබඳ පැහැදිලි කෙරෙන කථාවේ විශේෂත්වයක් තිබේ. ඊට හේතුව, භික්ෂූන්ගේ ඉල්ලීම පිට

බුදුරදුන් කථාව අරඹන්නේ අනුපමාගේ අතීත කර්මයක් පිළිබඳ පැහැදිලි කිරීමටයි. ඒ අනුව ඒ පිළිබඳ ඉතාම සැකෙවින් සඳහන් කරන අතර ඉන් අනතුරුව කථාවේ වැඩි අවකාශයක් වෙන් වන්නේ අනුපමාගේ පෙර භවයක මිතුරියක වූ, මෙකල ඉතා සුන්දරියකව උපන් 'ශ්‍රීමතී' සම්බන්ධ කථාවක් කීමටයි. මාකන්දිකාවදානය අවසන් වන්නේද මෙයිනි. මෙම කොටස ඇතුළත් කිරීම මාකන්දිකාවදානයේ එතෙක් පැවතගෙන ආ කථා ශෛලිය වෙනස්ම මගකට යොමු කරන අතර කථාව ප්‍රධාන තේමාවෙන් ඉවතට යන ආකාරයද පෙනේ.

## 04. මාකන්දිකාවදානයේදී කර්ම සංකල්පය ඉස්මතු වන අවස්ථා

කර්මය පිළිබඳ ඉගැන්වීම/පැහැදිලි කිරීම අවදාන කථාවල එක් ප්‍රධාන අරමුණක් බව පිළිගත් මතයකි. එම අදහස ප්‍රස්තුත අවදානයෙන්ද හඳුනාගත හැකිය. මීට ඉහතද පැහැදිලි කළ පරිදි මෙම අවදානයේ ඇතුළත් කථා පහක්ම වෙන් වන්නේ කර්මය පිළිබඳ පැහැදිලි කිරීමටයි. කථාවල ඒ ඒ චරිත වර්තමානයේ භුක්ති විඳින හොඳ හෝ නරක ඵලවලට බලපෑ මූලබීජ හෙවත් කර්ම මොනවාදැයි මෙහිදී දක්වා ඇත. ඒ ඒ අතීත කථාවලින් ඉස්මතු කෙරෙන අතීත කර්ම හා ඒවායේ වර්තමාන ඵල පහත පරිදි සැකෙවින් දැක්විය හැකිය.

| ඵලය | කර්මය |
|---|---|
| උදයන රජුගේ අගමෙහෙසිය මෙන්ම බොදු උවැසියක වූ ශ්‍යාමාවතී ඇතුළු පන්සියයක් කාන්තාවන් සිටි ප්‍රාසාදය ගින්නෙන් විනාශ වීම | බ්‍රහ්මදත්ත රජුගේ අගමෙහෙසිය ලෙස සිටි භවයකදී දිය කෙළියෙන් අධික සීතලට පත්ව පසේබුදුවරයෙකු වැඩ සිටි කුටියකට ගිනි තැබීම හා අන්තඃපුරයේ සෙසු පිරිස එය මැනවැයි අනුමත කිරීම |
| ශාක්‍යමුනි බුදුරදුන් හමුවේ සත්‍යය දැකීම (මාර්ග ඵල අවබෝධ කර ගැනීම) | ගිනි ගත් කුටියෙන් අහසට නැගි පසේබුදුරදුන්ට සේවා කර ඒ කර්මයේ විපාක වශයෙන් ධර්මාවබෝධය ලැබේවායි ප්‍රාර්ථනා කිරීම |
| ශ්‍යාමාවතී ප්‍රමුඛ පන්සියයක් පිරිවර කතුන් ගින්නෙන් විනාශ වෙද්දී කුබ්ජෝත්තරා පමණක් දිවි බේරා ගැනීම | බ්‍රහ්මදත්ත රජුගේ මෙහෙසිය විසින් උයනේ තිබූ කුටියකට ගිනි දැල්වීමට අණ කළද එහි පැවිද්දෙකු සිටින හෙයින් එය කළ නොහැකි බව අගමෙහෙසියට පවසා කුටියට ගිනි තැබීමෙන් බැහැර වීම |

| | |
|---|---|
| කුබ්ජෝත්තරා කුදු තැනැත්තියක වීම හා 'කුදු තැනැත්තිය' යනුවෙන් සමාජයේ ප්‍රසිද්ධ වීම | සංධාන නම් ධනවත් ගෘහපතියාගේ දියණිය ලෙස උපන් භවයේදී සිය නිවසේ දානයට වැඩි ගිලන් පසේබුදුවරයෙකුගේ කුදු බව අනුකරණය කර සිය පියාට පෙන්වීම |
| කුබ්ජෝත්තරා ශ්‍රුතධර තැනැත්තියක වීම | සංධාන ගෘහපතියාගේ දියණිය වශයෙන් උපත ලබා සිටියදී සිය නිවසේ දානයකට වැඩි වාත රෝගයෙන් පෙළෙන එක්තරා හිමිනමක් දන් වළඳද්දී පාත්‍රය සැලෙන විට කලාලයක් අතුරා උන්වහන්සේට දන් වැළඳීමට පහසුකම් සැපයීම හා 'යම් සේ ස්වාමීන් වහන්සේ දන් වළඳන පාත්‍රය සෙලවීම නතර වූයේද එසේම මගේ සිතටද ධර්මයෝ පිවිස ස්ථිරව තැන්පත් වෙත්වා' යනුවෙන් ප්‍රාර්ථනා කිරීම |
| උදයන රජුගේ මාළිගාවේ දාසියක වීම | සංධාන ගෘහපතියාගේ දියණියව සිටියදී පිරිවර කතුන්ට දාසි වාදයෙන් ඇමතීම |
| අනුපමා දින හතක් භූමි ගෘහයේ නිරාහාරව සිටියත් සිරුර නොවැරහී, නොමැලවී සිටීම | පෙර එක් භවයක කුඩා දැරියකව සිටියදී පිණ්ඩපාතයේ වැඩි පසේබුදුවරයෙකුට ප්‍රණීත ආහාර පූජා කිරීම |

වගුව 01

උක්ත අංක 01 වගුවේ ඇතුළත් තොරතුරු පිළිබඳ විමසීමේදී පැහැදිලි වන්නේ ඒ ඒ කර්මවලට අනුරූප විපාක ලැබෙන ආකාරය වර්තමාන ඵලය හා අතීත කර්ම සංසන්දනය කර බැලීමේදී තහවුරු වන බවයි. අවදාන සාහිත්‍යයේදී කර්ම හා කර්ම විපාක නිරූපණය කර ඇති ආකාරය පිළිබඳ අදහස් දක්වමින් Chris Clark පැහැදිලි කරන්නේ කර්ම, කර්මඵල/කර්මවිපාකයන් නිපදවීම සඳහා මුහුකුරා යන ආකාරය ඇඟවීම අවදාන සාහිත්‍යයේ ප්‍රධාන ක්‍රියාකාරීත්වයක් බවයි. අවදාන කථාවල ඇතුළත් කර්මය හා ඊට අදාළ ඵලය අතර පවතින දැඩි සමීපතාව මෙම අදහස ඉස්මතු කිරීමට හිතකර බලපෑමක් එල්ල කර ඇත.[6]

මීට අමතරව, අවදානයේ අවස්ථා කිහිපයකදීම කර්ම සංකල්පය පිළිබඳ ඉස්මතු වන ප්‍රකාශන දක්නට ලැබේ. ගිනිගත් ප්‍රාසාදයෙන් ඉහළට ගිය ශ්‍යාමාවතී සිය පිරිවරට පවසන්නේ 'සොහොවුරියනි, සැඩ පහරක් මෙන් වර්ධනයට මුල් වන, අනිවාර්යයෙන් අනාගතයේදී විපාක දෙන මේ දැඩි කර්ම අප විසින්ම කරන ලදි.

ඒවා අන් කවරෙකු වෙත යයිද?'[7] යනුවෙනි. ශ්‍යාමාවතී ප්‍රමුඛ ස්ත්‍රීන් පත් වූ මෙම අවාසනාවන්ත තත්ත්වයට හේතුව කුමක්දැයි උදයන රජු බුදුරදුන්ගෙන් විමසූ විට උන්වහන්සේ පවසන්නේ 'මහරජතුමනි, ඒ කාන්තාවන් විසින්ම කරන ලද කර්මයක් මත පදනම් වූවකි'[8] යනුවෙනි. ශ්‍යාමාවතී ප්‍රමුඛ ස්ත්‍රීන් පිරිස පෙර භවයකදී සිදු කළ අකුශල කර්මය පිළිබඳ බුදුරදුන් කථාව අවසානයේදී නැවත සිහිපත් කරයි.[9] මීට අමතරව මෙහිලා තවත් වැදගත් කරුණක් වන්නේ භික්ෂූන් විසින් බුදුරදුන්ගෙන් ඒ ඒ චරිත විසින් වර්තමාන විපාක ලැබීමට සිදුකළ පූර්ව කර්ම පිළිබඳ විමසීමයි.

උදා ඃ- "කිං භදන්ත කුබ්ජොත්තරයා කර්ම කෘතං යෙන කුබ්ජා සංවෘත්තා?"

"කිං භදන්ත කුබ්ජොත්තරයා කර්ම කෘතං යෙන ශ්‍රැතධරා ජාතා ?"

"කිං භදන්ත කුබ්ජොත්තරයා කර්ම කෘතං යෙන දාසී සංවෘත්තා ?"

"කිං භදන්ත අනුපමයා කර්ම කෘතං යදෙෂා නිරාහාරා භූමිභාගෙ ස්ථාපිතා අම්ලානගාත්‍රී චොත්‍ථිතා ?"

මෙසේ එක් එක් චරිතවල පූර්ව කර්ම පිළිබඳ භික්ෂූන් විසින් බුදුරදුන්ගෙන් විමසීමෙන් අනතුරුව බුදුරදුන් ඊට අදාළ අතීත පුවත පැහැදිලි කරයි. අවදාන සාහිත්‍යයේ ප්‍රධාන අපේක්ෂාවක් ලෙස සැලකෙන කර්ම සංකල්පය පිළිබඳ අවධාරණය කිරීම පිළිබඳ අවදාන රචකයන් හෝ සම්පාදකයන් විසින් දක්වා තිබෙන උනන්දුව මෙමගින් හඳුනාගත හැකිය. පූර්ව කර්ම පිළිබඳ භික්ෂූන් විසින් නැගූ ඍජු ප්‍රශ්නයට දීර්ඝ පිළිතුරක් දීමට පෙර බුදුරදුන් එක් වාක්‍යයකින් කෙටි පිළිතුරක් ලබා දීම මෙහිදී අනුගමනය කර ඇති ශෛලියයි. අදාළ අතීත කථාව පැවසෙන්නේ ඉන් අනතුරුවයි.

"භගවානාහ - ආභිරෙව මහාරාට් කර්මාණි කෘතාන්‍යුපචිතානි ලබ්ධසංභාරාණි පරිණතප්‍රත්‍යයානි පූර්වවද්‍යාවද්ඵලන්ති බලු දෙහිනාම්."

"භගවානාහ - කුබ්ජොත්තරයෙව භික්ෂවඃ කර්මාණි කෘතාන්‍යුපචිතානි පූර්වවද්‍යාවද්ඵලන්ති බලු දෙහිනාම්."

"භගවානාහ - අනුපමයෙව භික්ෂවඃ කර්මාණි කෘතාන්‍යුපචිතානි පූර්වවද්‍යාවද්ඵලන්ති බලු දෙහිනාම්."

ශ්‍යාමාවතී ගින්නෙන් දැවී විනාශ වීමට හේතු වූ පූර්ව කර්මය පැහැදිලි කර අවසානයේදී පූර්වාපර සන්ධි ගළපා කර්මය හා විපාකය අතර සම්බන්ධය සංසන්දනාත්මකව පෙන්වයි.

"...යදාභිඃ ප්‍රත්‍යෙකබුද්ධස්‍ය කුටිකාං දග්ධ්වා අනුමෝදිතම් තස්‍ය කර්මණො විපාකෙන බහූනි වර්ෂාණි නරකෙෂු පක්තා යාවදෙතර්හ්‍යපි දෘෂ්ටසත්‍යා අග්නිනා දග්ධාඃ. ...." (...යම් කලෙක මේ කතුන් විසින් පසේබුදුන්ගේ කුටිය දවා අනුමෝදනා කරන ලද්දේද (සතුටු වන ලද්දේද) ඒ කර්මයාගේ විපාක හේතුවෙන් බොහෝ වසර ගණනක් නරකවල පැසී දැනුත් හෙවත් මේ භවයේදීත් ගින්නෙන් දැවුණහ....)

ශ්‍යාමාවතී ඇතුළු පිරිස මාර්ගඵල අවබෝධ කර ගැනීමට තරම් බලපෑ පූර්ව කර්මය කුමක්දැයි රජු බුදුරදුන්ගෙන් නොවිමසුවත් උන්වහන්සේ ඒ පිළිබඳ මෙම අදියරේදී සඳහන් කරති.

"...යත්ප්‍රණිධානං කෘතං තෙන මමාන්තිකෙ සත්‍යදර්ශනං කෘතම්."

ශ්‍යාමාවතී ප්‍රමුඛ කාන්තාවන්ගේ පූර්ව කර්මය පිළිබඳ පැහැදිලි කිරීමෙන් අනතුරුව බුදුරදුන් උදයන රජුට අනුශාසනාවක් ස්වරූපයෙන් පවසන්නේ 'මහරජතුමනි, මෙසේ ඒකාන්තයෙන්ම කෘෂ්ණ වූ කර්මවල (විපාක) හෙවත් පව්කම්වල පෙර කී පරිද්දෙන් පරිභෝග කළ යුතුය.[10] රජතුමනි, ඔබ මෙසේ හික්මිය යුතුය.' යනුවෙනි. මෙම ප්‍රකාශනය ප්‍රස්තුත අවදානය තුළ සුවිශේෂී වන්නේ අතීත කර්ම හා කර්ම විපාක පිළිබඳ පැහැදිලි කෙරෙන සෙසු අවස්ථාවල මෙම ප්‍රකාශය සඳහන් නොවන බැවිනි.

අනෙකුත් කථා අවසානයේදීද කර්මය හා කර්ම විපාකය දක්වා ඇත. ඒ අනුව, කුබ්ජෝත්තරාගේ කුදු වීමට අදාළ කථාව අවසානයේදී,

"...යදනයා ප්‍රත්‍යෙකබුද්ධො විනාඩිතඃ තස්‍ය කර්මණො විපාකෙන කුබ්ජා සංවෘත්තා." යනුවෙන්ද

කුබ්ජෝත්තරා ශ්‍රැතධර වීමට අදාළ කථාව අවසානයේදී,

"...යත්තයා ප්‍රණිධානං කෘතං තස්‍ය කර්මණො විපාකෙන ශ්‍රැතධරා සංවෘත්තා." යනුවෙන්ද දක්වා ඇත.

කුබ්ජෝත්තරා දාසියක වීම පිළිබඳ කර්මය හා කර්ම විපාකය වාක්‍ය දෙකකට සීමා වෙයි. එනම්,

"භගවානාහ - අනයා භික්ෂුවස්තත්‍රෛශ්වර්යමදමත්තයා පරිජනො දාසීවාදෙන සමුදාචරිතඃ. තස්‍ය කර්මවිපාකෙන දාසී සංවෘත්තා."

අනුපමා දින හතක් භූමි ගෘහයේ නිරාහාරව සිටියත් සිරුර නොවැරහී, නොමැලවී සිටීමට අදාළ කථාව අවසානයේදී "තත්කර්මණො විපාකෙනානුපමා ජාතා..."[11] යනුවෙන් සඳහන් කරයි.

සමස්තයක් වශයෙන් විමසා බැලීමේදී දිව්‍යාවදානයේ අතීත කථාවලදී කර්ම සංකල්පය ඉස්මතු කරන අවස්ථා පියවර කිහිපයක් යටතේ හඳුනාගත ගත හැකිය.

**පළමු පියවර**

යම් සිදුවීමකින් අනතුරුව භික්ෂූන් විසින් බුදුරදුන්ගෙන් යමෙකුගේ වර්තමාන කර්ම විපාකයට හේතු වූ අතීත කර්මය පිළිබඳ විමසීම

**දෙවැනි පියවර**

භික්ෂූන්ගේ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් බුදුරදුන් විසින් දීර්ඝ පිළිතුරක් දීමට පෙර එක් වාක්‍යයකින් කෙටි පිළිතුරක් ලබා දීම

**තෙවැනි පියවර**

කර්ම විපාකයට බලපෑ අතීත කර්මය පැහැදිලි කරන කථාව බුදුරදුන් විසින් දීර්ඝ වශයෙන් පැවසීම

**සිව්වැනි පියවර**

පූර්වාපර සන්ධි ගැළපීම

**පස්වැනි පියවර**[12]

පූර්වාපර සන්ධි ගළපා කර්මය හා විපාකය අතර සම්බන්ධය සංසන්දනාත්මකව පෙන්වීම හා ඒ ආශ්‍රයෙන් උපදේශයක් ලබාදීම

**05. මාකන්දිකාවදානයේ සැකැස්ම හා රචනා ශෛලිය**

දිව්‍යාවදානයේ සමස්ත කථාවල සැකැස්ම පිළිබඳ අවධානය යොමු කළ Rotman ඒවා වර්ග තුනක් යටතේ වෙන් කර හඳුනාගනී. එනම්,

1. බුදුරජාණන් වහන්සේ සහ ඇතැම් විට උන්වහන්සේගේ ශ්‍රාවකයෙක් ආරාමික ජනයාට පැනනැඟි ප්‍රශ්නයකට හෝ සැකයකට පිළිතුරු වශයෙන් පවසන කථා
2. බුදුරදුන් වෙතට එළඹි ගිහියෙකුට හෝ ශ්‍රාවක පිරිසකට පවසන කථා
3. ගිහි ශ්‍රාවකයෙකුගේ නිවසක දානයක් සඳහා ආරාධනා ලැබ දානය වැළඳීමෙන් අනතුරුව පවසන කථා[13] යනුවෙනි.

මාකන්දිකාවදානය අයත් වන්නේ උක්ත ප්‍රථම වර්ගයටයි. එහි තවත් විශේෂ ලක්ෂණයක් වශයෙන් Rotman හඳුනාගන්නේ යමෙකුගේ කර්ම සම්බන්ධ අතීතය හා අනාගතය විවරණය කිරීමට මෙම කථාවල අවකාශය වෙන් වන බවයි.[14]

මාකන්දිකාවදානයේ සැකැස්ම පියවර දහතුනක් ඔස්සේ සැකෙවින් දැක්විය හැකිය.

01. අවදානයේ ආරම්භය : මාකන්දික විසින් බුදුරදුන් දැකීම හා සිය දියණිය සරණපාවා දීමට උචිත අයෙකැයි සිතා අනුපමා හා බිරිඳ බුදුන් වෙත කැඳවාගෙන ඒම, බුදුරදුන්ට සිය අදහස පැවසීම හා බුදුරදුන් එය ප්‍රතික්ෂේප කිරීම, ඉනික්බිතිව මහලු භික්ෂුවක් අනුපමා තමන්ට දෙන ලෙස ඉල්ලා සිටීම හා ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම.

02. බුදුරදුන් විසින් අතීත භවයකදීද අනුපමා ප්‍රතික්ෂේප කළ බව පැහැදිලි කෙරෙන අතීත කථාව.

03. අතීත භවයකදීද මහල්ලක අනුපමා හේතුවෙන් විපතෙහි වැටුණු අයුරු පැහැදිලි කෙරෙන අතීත කථාව.

04. අනුපමා - මාකන්දික දෙදෙනාගේ උදයන රාජ හමුව, අනුපමා උදේන රජුගේ අගමෙහෙසිය බවට පත්කර ගැනීම, මාකන්දිකට අගමැති තනතුර ලැබීම, බෞද්ධෝපාසිකාවක වූ ශ්‍යාමාවතී අගමෙහෙසියගෙන් පලිගැනීමට අනුපමා යොදන උපක්‍රම හා ඒවා අසාර්ථක වීම, ප්‍රත්‍යන්ත ප්‍රදේශයක ඇති වූ කෝලාහලයක් සංසිඳවීමට උදේන රජු සේනාව සමග පිටත් වීම හා ඒ අතරතුර අනුපමා විසින් පියාගේ උපකාරයෙන් ශ්‍යාමාවතී ප්‍රමුඛ පන්සියයක් කතුන් සිටි ප්‍රාසාදයට ගිනි තැබීම හා කුබ්ජෝත්තරා පමණක් දිවි ගලවා ගැනීම.

05. ශ්‍යාමාවතී ප්‍රමුඛ කාන්තාවන්ගේ මරණයෙන් පසුව බුදුරදුන් විසින් භික්ෂූන්ට කරන අනුශාසනාව අනුපමාට 'මූත්‍රපුරීෂ'වාදයෙන් ඇමතීමෙන් පසුව බුදුන් වහන්සේ මෙම අවදානයේ පෙනී සිටින්නේ මෙහිදීය. මාකන්දික කළ පාප කර්මයේ බරපතලකම මෙන්ම ශ්‍යාමාවතී ඇතුළු පිරිස තුළ අනාගාමී ඵලයට පත්වූවන්ගේ සිට ස්වර්ගගාමී වීමට තරම් සුදුසුකම් ලද්දන් සිටි බව බුදුරජ මෙහිදී භික්ෂූන්ට පෙන්වා දෙයි. අනතුරුව ශ්‍යාමාවතී ඇතුළු පිරිසේ මළ සිරුරු තැන්පත් කර තිබෙන ස්ථානයට භික්ෂූන් සමග එළඹෙන බුදුරජ මළ සිරුරු ඉදිරියේදීම අනිත්‍යය පිළිබඳ ධර්ම දේශනාවක් පවත්වයි. මෙම ධර්ම දේශනාවේ විශේෂත්වය වන්නේ කර්මය පිළිබඳ කිසිවක් සඳහන් නොකිරීමයි.

06. ශ්‍යාමාවතී ප්‍රමුඛ ඇතොවුරේ කතුන් මිය ගිය බව ඇමතිවරුන් විසින් උපක්‍රමයක් මගින් රජුට දැන්වීම, රජු මාළිගාවට පැමිණීම හා අනුපමාටත් මාකන්දිකටත් දඬුවම් දීම.

07. ශ්‍යාමාවතී ඇතුළු පිරිසේ මරණයට හේතු වූ පූර්ව කර්මය පැහැදිලි කරමින් බුදුරදුන් විසින් උදේන රජුට පැවසෙන කථාව.

08. කුබ්ජෝත්තරාගේ කුදු බවට හේතු වූ අතීත කර්මය පැහැදිලි කරමින් බුදුරදුන් භික්ෂූන්ට පවසන කථාව.

09. කුබ්ජෝත්තරා ශ්‍රැතධර වීමට හේතු වූ අතීත කර්මය පැහැදිලි කිරීම.

10. කුබ්ජෝත්තරා දාසියක වීමට බලපෑ අතීත කර්මය පැහැදිලි කිරීම.

11. සත් දිනක් නිරාහාරව සිටියද අනුපමාගේ සිරුර දුර්වල නොවීමට හේතු වූ අතීත කථාව.

12. අනුපමාගේ පෙර භවයක මිතුරියක වූ ශ්‍රීමතී පිළිබඳ කථාව.

13. දෘෂ්කෘතාපත්තිය පිළිබඳ බුදුරදුන්ගේ පැහැදිලි කිරීම සමග අවදානය නිමා වීම යනුවෙනි.

### 05. 01. 'උපක්‍රම' සමග අවදානය ඉදිරියට ඇදෙන ආකාරය

මාකන්දිකාවදානය 'උපක්‍රම' මත පදනම්ව ඉදිරියට ඇදෙන අවදානයක් වශයෙන් හඳුනාගත හැකිය. මෙහි 'උපක්‍රම' යනුවෙන් අදහස් කරන්නේ අවදානයේ එක් එක් සංසිද්ධි මත පදනම්ව ඇතැම් චරිත විසින් තවත් චරිතයක යහපතට හෝ අයහපතට යොදන උපාය මූලික කටයුතුය. මෙම අවදානය තුළ එවැනි උපක්‍රම හතක් හඳුනාගත හැකිය. එනම්,

1. පළමු අතීත කථාවේදී සිය ශිල්පීය දක්ෂතාවට සමාන හෝ අධික දක්ෂයෙකුට සිය රූපවත් දියණිය විවාහ කර දීමේ අදහසින් සිටි පියාගේ මානය බිඳහෙළීමට තරුණයෙකු විසින් යොදන උපක්‍රමය
2. දෙවැනි අතීත කථාවේදී සිංහල වෙළෙන්දා සිංහල ද්වීපයට රැගෙන යාමට රාක්ෂසිය විසින් යොදන උපක්‍රමය හා
3. එම කථාවේදීම සිංහල රජු විසින් රාක්ෂසියන් පළවා හැර සිංහල ද්වීපය සිය යටතට ගැනීමට යොදන උපක්‍රමය
4. අනුපමා විසින් ශ්‍යාමාවතී පිළිබඳ රජුගේ ප්‍රසාදය දුර්වල කිරීමට යොදන උපක්‍රම
5. අනුපමා විසින් ශ්‍යාමාවතී ඝාතනය කිරීමට යොදන උපක්‍රමය
6. ශ්‍යාමාවතීගේ මරණය පිළිබඳ අප්‍රියාඛ්‍යායින් මගින් රජුට දැනුම් දීමට ඇමතිවරුන් විසින් යොදන උපක්‍රමය[15]
7. යන්ත්‍රගෘහයේ දමා දවන්නට නියම වූ අනුපමා යෝගන්ධරායණ අගමැතිවරයා විසින් භූමිගෘහයේ දමා තැබීම යනුවෙනි.

මේ හේතුවෙන් අවදානයේ කථා රසයේ විචිත්‍රත්වයක් ඉස්මතු වේ.

අවදාන සාහිත්‍යයේ රචනා ශෛලිය ඊටම ආවේණික වූ ලක්ෂණවලින් සමන්විත වූවකි. කෙටි වාක්‍යවලට මූලිකත්වය දෙන අතර වාර්තා ස්වරූපයත් ප්‍රකෘති භාෂණයත් මිශ්‍ර ශෛලියක් අනුගමනය කර තිබීම මෙහිදී කැපී පෙනෙන අනෙකුත් ලක්ෂණයි. දිව්‍යාවදානයේ බොහෝ අවදාන ගද්‍ය - පද්‍ය මිශ්‍ර වූ ඒවා වන අතර ඇතැම් අවදානයක අධික ලෙස පද්‍ය ඇතුළත් අතර එකදු පද්‍යයක්වත් නොමැති අවදාන කිහිපයක්ද අවම පද්‍ය සංඛ්‍යාවක් සහිත අවදාන කිහිපයක්ද වේ. මාකන්දිකාවදානයේ රචනා ශෛලිය පිළිබඳ විමසීමේදී විශේෂයෙන් හඳුනාගත හැකි ලක්ෂණ කිහිපයකි.

### 05.02. 'පූර්වවද්‍යාවත්'[16] ප්‍රයෝගය

දිව්‍යාවදානයේ අවදාන කිහිපයකම දක්නට ලැබෙන මෙම ප්‍රයෝගය මාකන්දිකාවදානයේ අවස්ථා කිහිපයකදීම හමුවන යෙදුමකි. පෙර දක්වන

ලද තොරතුරක් හෝ විස්තරයක් සංක්ෂේපයෙන් දැක්වීමට හා එමගින් සිදුවන පුනරුක්ති දෝෂය මගහරවා ගැනීම මෙවැනි යෙදුමක අපේක්ෂාවයි. කෙසේ වෙතත් දිව්‍යාවදානයේදී මෙය භාවිත ආකාරය පිළිබඳ අදහස් දක්වමින් Sathoshi පවසන්නේ දිව්‍යාවදානයේ සම්පාදකයා/සම්පාදකයන් විසින් මූලසර්වාස්තිවාද විනයෙන් ඇතැම් කොටස් ණයට ගත් බවට මෙය සාක්ෂ්‍යයක් බවයි. මේ සම්බන්ධයෙන් Huber ගේ අදහස වන්නේ එක් මූලාශ්‍රයක කරුණු තවත් මූලාශ්‍රයකට අවිචාරාත්මකව උපුටා ගැනීමක ලක්ෂණ මෙයින් පෙනී යන බවය. සාමාන්‍යයෙන් මෙම ප්‍රයෝගයේ අරමුණ ඉතා ආසන්නව සඳහන් කළ කරුණකට නැවත යොමුවක් දැක්වීම වුවත් දිව්‍යාවදානයේදී මෙය යොදා ඇත්තේ තරමක් වෙනස් ආකාරයකටයි. Cowell ගේ හා Niel ගේ දිව්‍යාවදාන සංස්කරණය ඇසුරින් Sathoshi පෙන්වා දෙන ආකාරයට මුද්‍රිත පිටු සියයක් හෝ ඊට ආසන්න ගණනකට පෙර සඳහන් කළ යම් කරුණක් නැවත සංක්ෂේපයෙන් දැක්වීමට (ඇතැම් අවස්ථාවක) මෙම ක්‍රමවේදය භාවිත කර තිබේ. එහෙත් එය සාර්ථක ක්‍රමවේදයක් නොවන බව අමුතුවෙන් කිව යුතු නොවන අතර Sathoshi ගේ අදහස වන්නේ මූලසර්වාස්තිවාද විනයේදී ක්‍රමවත් ලෙස භාවිත කර ඇති මෙම ප්‍රයෝගය දිව්‍යාවදානය අනවබෝධයෙන් ණයට ගෙන භාවිත කර ඇති බවයි.[17]

**05.03. රචනා ශෛලියේ විශේෂතා කිහිපයක්**

කිසියම් චරිතයක්, සිදුවීමක් හෝ අවස්ථාවක් පිළිබඳ සඳහන් කිරීමේදී ඒ පිළිබඳ විශේෂණ වශයෙන් වචන මාලාවක් භාවිත කර තිබේ. උදාහරණ වශයෙන් අනුපමා පිළිබඳ සඳහන් කරන ප්‍රථම අවස්ථාවේදී "අභිරූපා දර්ශනීයා ප්‍රාසාදිකා සර්වාංගප්‍රත්‍යංගොපේතා" යනුවෙන් ඇය පිළිබඳ වර්ණනාත්මක වචන මාලාවක් භාවිත කර ඇත. මීට අමතරව, බද්ධ පර්යංකයෙන් වැඩ සිටින බුදුරදුන් පිළිබඳ වර්ණනා කිරීමේදීද (...ප්‍රාසාදිකං ප්‍රදර්ශනීයං ශාන්තේන්ද්‍රියං ශාන්තමානසං පරමෙන චිත්තව්‍යුපශමෙන සමන්වාගතං සුවර්ණයූපමිව ශ්‍රියා ජ්වලන්තම්.) සිංහල වෙළෙන්දාගේ පුත්‍රයා පිළිබඳ කරන විස්තරයේදීද (දාරකො ජාතො අභිරූපො දර්ශනීයඃ ප්‍රාසාදිකො ගෞරඃ කනකවර්ණඃ ඡත්‍රාකාරශිරඃ ප්‍රලම්බබාහුර්විස්තීර්ණලලාටං උච්චඝොණඃ සංගතභ්‍රූ තුඞ්ගනාසඃ සර්වාංගප්‍රත්‍යාංගොපෙතඃ.) මෙම ලක්ෂණය විශේෂයෙන් කැපී පෙනෙයි.

ප්‍රතිකථනය හෙවත් එකම තොරතුර නැවත නැවත සඳහන් කිරීම මෙම අවදානයේ අවස්ථා දෙකක විශේෂයෙන් දක්නට ලැබේ. එනම්, දෙවැනි අතීත කථාවේදී රකුසිය විසින් විවිධ පුද්ගලයන්ට තමන්ව හඳුන්වා දෙමින් කරන ප්‍රකාශය[18] හා ශ්‍යාමාවතීගේ මරණය සම්බන්ධ සිදුවීම සිතුවමට නැගිය යුතු ආකාරය විස්තර වන අවස්ථාවයි. මීට අමතරව, එකම ශබ්දය දෙවරක් යෙදීමේ ශෛලිය අවස්ථා කිහිපයකම දක්නට ලැබේ.[19] යමක් 'මැනවි' යැයි අනුමත කිරීමට "ශොභනම්" යන ව්‍යවහාරය හැම විටම භාවිත කර තිබේ.

අවදානයේ සිදුවීම් පිළිවෙළින් ඉදිරිපත් කරන අතර සඳහන් කර ඇති ආප්ත වාක්‍ය ස්වරූපයේ ප්‍රකාශන කිහිපයක්ම මෙහිදී හමුවේ. ඒවා භාවිත කර ඇත්තේ

අවදානයේ අදාළ අවස්ථාව විශේෂයෙන් ඉස්මතු කිරීමට බව පැහැදිලිය. කෙසේ වෙතත් මෙවැනි ඇතැම් ප්‍රකාශනවල ඇති විශ්ව සාධාරණ ස්වභාවය හේතුවෙන් අවදානයේ ප්‍රස්තුතයෙන් බැහැරට ගත්තද එහි අර්ථයට හානියක් නොවේ.[20] ඉතා සීමිත වචන ප්‍රමාණයකට සීමා වන මෙම පාඨ දිව්‍යාවදානයේ සම්පාදකයන් විසින් අදාළ අවස්ථාව විශේෂයෙන් අවධාරණය කිරීම සඳහා මැනවින් සිතා බලා අවස්ථෝචිත ලෙස අවදානය සමග බද්ධ කර තිබෙන බව පෙනේ. ඒවා වෙනත් මූලාශ්‍රයකින් උපුටා ගෙන සන්දර්භය පිළිබඳ සලකා මෙහි ඇතුළත් කර ඇත්දැයි ඉඳුරාම පැවසිය නොහැකිය. එවැනි ආප්ත වාක්‍ය ස්වරූපයේ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ

"සර්වා ඒව ස්ත්‍රියො රාක්ෂස්‍යඃ"[21] (සියලුම ස්ත්‍රීහු රාක්ෂසියෝය.)

"මිත්‍රාමිත්‍රමධ්‍යමො ලොකඃ"[22] (ලෝකය මිතුරු, සතුරු, මධ්‍යම ස්වභාව ඇත.)

"ඊර්ෂ්‍යාප්‍රකෘතිර්මාතෘගාමඃ"[23] (ස්ත්‍රීහු ඊර්ෂ්‍යාව ස්වභාවය කොට ඇත්තෝය.)

"විස්තීර්ණානි රාජකාර්යාණි"[24] (රජුගේ කටයුතු පුළුල්ය.)

"ස්ත්‍රීවශගා රාජානඃ"[25] (රජවරු ස්ත්‍රීන්ට වශග වූවෝය.)

දිව්‍යාවදානයේ කථාවල රචනා ශෛලියේ පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණයක් වන ගද්‍ය - පද්‍ය මිශ්‍රව භාවිත කිරීම මෙම අවදානයේදීද එලෙසින්ම දක්නට ලැබේ. සංඛ්‍යාත්මකව දක්වන්නේ නම් පද්‍ය විසිපහක් මෙහි ඇතුළත් අතර එය දිව්‍යාවදානයේ බොහෝ අවදාන කථාවල පද්‍ය භාවිතය සමග සැසඳීමේදී එය සැලකිය යුතු තරමේ පද්‍ය බාහුල්‍යයක් වශයෙන් හඳුනාගත නොහැකිය. මෙකී පද්‍ය විසිපහෙන් පද්‍ය දහ අටක්ම ඇතුළත් වන්නේ බුදුරදුන් විසින් පෙර භවයකදීද අනුපමා ප්‍රතික්ෂේප කළ බව ප්‍රකට කෙරෙන ප්‍රථම අතීත කථාවට පෙරයි. අවදානයේ සෙසු කොටස පුරාම ඇත්තේ පද්‍ය හතක් පමණි. එය කැපී පෙනෙන ලක්ෂණයක් වශයෙන් හඳුනාගත හැකිය. මුල් පද්‍ය දහ අටෙන් පද්‍ය නවයක් මාකන්දිකගේ භාර්යාව වූ සාකලික විසින්ද, පද්‍ය තුනක් මාකන්දික විසින්ද, පද්‍ය හතරක් බුදුරදුන් විසින්ද, පද්‍ය දෙකක් මහල්ලක විසින්ද පැවසේ. මේ අතර එකේ සිට දහය දක්වා පද්‍ය සාකලික - මාකන්දික අතර සිදු වන සංවාදයක ස්වරූපයෙන් දක්වා ඇත. තවද, සාකලිකගේ අදහස්වලට ප්‍රතිචාර වශයෙන් මාකන්දික දක්වන්නේ එකම පද්‍යමය ප්‍රතිචාරයකි.[26] සෙසු පද්‍ය හතෙන් හයක්ම ඇතුළත් කර තිබෙන්නේ ඒ ඒ අතීත කථාවල සඳහන් වන චරිත විසින් පවසනු ලබන ආකාරයටයි. ඒ අතරින් එක් පද්‍යයක් පමණක් බුද්ධ භාෂිතයක් උපුටා දැක්වීමකි.[27]

අවදානයට පද්‍ය ඇතුළත් කිරීමේදී '...ගාථාං භාෂතෙ, ඉදමවොචත්, උක්තඤ්ච ...' යන සම්බන්ධීකාරක ප්‍රයෝග භාවිත කර තිබේ. එය දිව්‍යාවදානයේ අවදානවලට පද්‍ය ඇතුළත් කිරීමේදී භාවිත කර ඇති සාමාන්‍ය ශෛලියයි. එහෙත් එහි සෙසු අවදානවල මෙහිලා භාවිත කර ඇති 'ආහ ච' යන සම්බන්ධීකාරක ප්‍රයෝගය මෙම අවදානයේදී හමු නොවේ.

## 06. මාකන්දිකාවදානයට සමගාමී වෙනත් මූලාශ්‍රයන්

### 06.01. මජ්ඣිම නිකායේ හා සුත්ත නිපාතයේ ඇතුළත් 'මාගන්දිය සූත්‍ර'

පාලි සූත්‍ර සාහිත්‍යය තුළ 'මාගන්දිය' නමින් සූත්‍ර දෙකක් හමුවේ. එනම්, මජ්ඣිම නිකායේ පරිබ්බාජක වග්ගයේ මාගන්දිය සූත්‍රය හා ඛුද්දක නිකායේ සුත්ත නිපාතයේ අට්ඨක වග්ගයේ මාගන්දිය සූත්‍රයයි. එකිනෙකට වෙනස් ප්‍රස්තුත පිළිබඳ ඇතුළත් මෙම සූත්‍ර දෙකම බුදුරදුන් හා මාගන්දිය අතර සිදුවන සංවාදයක ස්වරූපයෙන් යුක්ත වේ. පෙර සඳහන් කළ සූත්‍ර දෙක අතරින් පළමු වැනි සූත්‍රයේ මුල් කොටස හා මාකන්දිකාවදානයේ මුල කොටස අතර යම් යම් සමාන ලක්ෂණ හඳුනාගත හැකිය. ඒ පිළිබඳ සංසන්දනයක් පහත දැක්වේ.

| මාගන්දිය සූත්‍රය | මාකන්දිකාවදානය |
|---|---|
| බුදුරදුන් කුරු ජනපදයේ කම්මාස්සදම්ම නමැති කුරු රටවැසියන්ගේ නිගමෙහි (භාරද්වාජ ගෝත්‍ර බමුණාගේ අග්නිහෝත්‍ර ශාලාවේ තණ ඇතිරියක) වැඩ සිටී. | බුදුන් වහන්සේ කුරු ජනපදයේ චාරිකාවේ හැසිරෙන්නේ කල්මාෂදම්‍ය නමැති කුරුන්ගේ නිගමෙහි වාසය කරයි. |
| එකල්හි භාග්‍යවතුන් වහන්සේ පූර්වාහ්න සමයෙහි හැඳ පෙරවාගෙන පාත්‍රය හා සිවුරු රැගෙන කම්මාස්සදම්මයට පිඬු පිණිස පිවිසියහ. | ඉක්බිති බුදුන් වහන්සේ පූර්වාහ්ණ සමයෙහි හැඳ පෙරවාගෙන පාත්‍රය හා සිවුරු රැගෙන පිඬු පිණිස කල්මාෂදම්‍යයට පිවිසයහ. |
| කම්මාස්සදම්මයෙහි පිඬු සිඟා පසුබත් වේලෙහි පිණ්ඩපාතය ප්‍රතික්ෂේප කළේ දිවා විහරණය පිණිස එක්තරා වන ලැහැබකට පිවිසියහ. | බුදුන් වහන්සේ කල්මාෂදම්‍යයෙහි පිඬු පිණිස හැසිර කරන ලද බත් කිස ඇත්තේ පසුබත් වේලෙහි පිණ්ඩපාතය ප්‍රතික්ෂේප කළේ (පාසිවුරු එළා දෙපා සෝදා) එක්තරා ගසක් ඇසුරු කොට බද්ධ පර්යංකයෙන් සිටියහ. |
| එකල්හි මාගන්දිය පිරිවැජියා ජංඝාවිහරණයෙහිලා සක්මනෙහි හැසිරෙන්නේ භාරද්වාජගෝත්‍ර බමුණාගේ ගිනි දෙවොල වෙත පැමිණියේය. | එකල්හි මාකන්දික පිරිවැජියා මල් හා දර සොයනු පිණිස බැහැරට ගියේ වෙයි. |

| | |
|---|---|
| හෙතෙම භාරද්වාජ ගෝත්‍ර බමුණාගේ ගිනි දෙවොලෙහි පනවන ලද තණ ඇතිරියක් දුටුවේය. | මාකන්දික තෙමේ එක්තරා රුක්මුලක් ඇසුරු කොට බද්ධ පර්යංකයෙන් සිටින බුදුරදුන් දුටුවේය.<br>............<br>මාකන්දික තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ තණ ඇතිරිය දුටුවේය. |

02 වගුව

මෙයින් පසුව මාගන්දිය සූත්‍රයේත් මාකන්දික අවදානයේත් අන්තර්ගතය එකිනෙකට සම්පූර්ණයෙන් වෙනස් වේ. මීට අමතරව, සුත්ත නිපාතයේ ඇතුළත් මාගන්දිය සූත්‍රයේ ප්‍රථම ගාථාව හා අවදානයේ එක් ශ්ලෝකයක් අතර කැපී පෙනෙන සමාන බවක් වේ.

| මාගන්දිය සූත්‍රය | අවදානය |
|---|---|
| දිස්වාන තණ්හං අරතිං රගඤ්ච<br>නාහොසි ඡන්දො අපි මෙථුනස්මිං<br>කිමෙවිදං මුත්තකරීසපුණ්ණං<br>පාදාපි නං සම්ඵුසිතුං න ඉච්ඡේ | දෘෂ්ටා මයා මාරසුතා හි විප්‍ර<br>තෘෂ්ණා න මෙ නාපි තථා රතිශ්ච<br>ඡන්දො න මෙ කාමගුණෙෂු කශ්චිත්<br>තස්මාදිමාං මූත්‍රපුරීෂපූර්ණාං<br>ප්‍රෂ්ටුං හි යත්තාමපි නොත්සහෙයම් |

03 වගුව

## 06.02. මූලසර්වාස්තිවාදී විනය හා මාකන්දිකාවදානය

දිව්‍යාවදානයේ කථාවල ආකෘතිය පිළිබඳ අධ්‍යයනය කළ Sathoshi පවසන්නේ දිව්‍යාවදානයේ අතුළත් අවදාන තිස්අටෙන් දහනවයක්ම මූලසර්වාස්තිවාදී විනය සමග සමාන වන බවයි. කෙසේ වෙතත් මෙම මූලාශ්‍රය දෙක අතර පවතින සමානතා සම්බන්ධයෙන් විචාරක මත දෙවැදෑරුම් වේ. එනම්, 01). මෙහි එක් මූලාශ්‍රයක් අනෙකෙන් තොරතුරු ණයට ගෙන ඇත, 02). මෙම කෘති දෙකම කිසියම් වෙනත් එක් මූලාශ්‍රයක් ඇසුරු කර රචනා වී ඇත යනුවෙනි. දිව්‍යාවදානය හා මූලසර්වාස්තිවාදී විනය අතර පවතින සමාන ලක්ෂණ පිළිබඳව අධ්‍යයනය කරන Sathoshi පවසන්නේ දිව්‍යාවදානය සම්පාදනය කිරීමේදී අඩුම තරමේ කථා කිහිපයක් හෝ මූලසර්වාස්තිවාද විනයෙන් ණයට ගෙන ඇති බවයි.[28] මේ පිළිබඳ Rotman ගේ අර්ථකථනයද මීට සමගාමී වේ. ඔහුට අනුව කිසියම් කාල වකවානුවකදී කිසිවෙකු විසින් දිව්‍යාවදානය නමැති අනර්ඝ මට්ටමේ සංග්‍රහයක් නිර්මාණය කිරීමට මූලසර්වාස්තිවාද විනයෙන් ඇතැම් කථා සංක්ෂේපයෙන් (Abridged) ගෙන ඉන් අනතුරුව එම කථා වෙනත් විනය සංග්‍රහවල ඇතුළත් කථා, ඇතැම් සූත්‍ර හා වෙනත් රසවත් කථා සමග සංග්‍රහ කර ඇති බවයි.[29]

මූලසර්වාස්තිවාදි විනයෙහි පවතින කැපී පෙනෙන ලක්ෂණ දෙකක් වශයෙන් Sathoshi හඳුනාගන්නේ පාලි විනය පිටකයේ එක් එක් විනය ප්‍රඥප්ති සම්බන්ධයෙන් වන හැඳින්වීමේ කථාවලට (Introductory Stories) වඩා මූලසර්වාස්තිවාදි විනයේ එම කොටස දීර්ඝ වීම හා භික්ෂූන්ගේ හා ගිහියන්ගේ අතීත භව පිළිබඳ කථා බහුල ලෙස ඇතුළත් කර තිබීමයි. Sathoshi ගේ අනාවරණයට අනුව දිව්‍යාවදාන කථාවල ඇතුළත් මූලසර්වාස්තිවාදයෙන් උපුටා ගත් කොටස් හඳුනා ගැනීමට මූලසර්වාස්තිවාද විනයේ විද්‍යමාන උක්ත ලක්ෂණ දෙක ඉතා වැදගත් වේ.[30]

Sathoshi සිය පැහැදිලි කිරීමේදී තවදුරටත් පෙන්වා දෙන්නේ දිව්‍යාවදානයේ සම්පාදකයන් විසින් මූලසර්වාස්තිවාද විනයේ ඇතුළත් හැඳින්වීමේ කථා (Introductory Stories) හා අතීත ජීවන කථා දක්ෂ ලෙස උපුටා ගෙන ඇතත් ඇතැම් අවස්ථාවල සම්පාදකයන් අතින් නිසි අවධානයෙන් තොරව මූලසර්වාස්තිවාද විනයේ ඇතැම් කොටස් උපුටාගෙන ඇති බවයි. කථාවකට පසුව තිබෙන විනය සම්බන්ධ විස්තරයක් හෙවත් විනය ප්‍රඥප්තියක් පැනවීමට හේතු වූ පසුබිම සඳහන් විස්තරය හා විනය ප්‍රඥප්තිය පිළිබඳ විස්තර වන කොටස (Commentary on the rule) දිව්‍යාවදානයේ සම්පාදකයන් විසින් නිසි අවධානයෙන් තොරව මූලසර්වාස්තිවාදි විනයෙන් උපුටා ගෙන ඇති බව Sathoshi හඳුනාගනී. මේ හේතුවෙන් අවදානයේ කථා ශෛලිය හා කථාවේ ගමන් මග ඉඳුරාම වෙනස් මගක් ගනු ලබන අතර අවදානයේ සිදු වන එම වෙනස අපහසුතාවකින් තොරව හඳුනාගත හැකිය. මෙම අදහස සනාථ කිරීම සඳහා Sathoshi විසින් මාකන්දිකාවදානය එක් උදාහරණයක් වශයෙන් ගෙන විග්‍රහ කරනු ලැබේ. මාකන්දිකාවදානයේ අවසන් කොටසේදී අනුපමා විසින් පෙර කළ පින්කමක් පිළිබඳව ඉතා සැකෙවින් පවසා ඇගේ මිතුරියක වූ ශ්‍රීමතී පිළිබඳ කෙරෙන විස්තරය අවසන් වන්නේ භික්ෂූන්ට දුෂ්කෘත ආපත්තිය සිදුවිය හැකි ආකාරය පිළිබඳ බුදුන් වහන්සේගේ පැහැදිලි කිරීමකිනි. Sathoshi පෙන්වා දෙන්නේ එම කොටස මූල සර්වාස්තිවාදි විනයෙන් සෘජුවම උපුටාගෙන ඇති බවයි.[31]

**06.03. ධම්මපදට්ඨකථාව හා මාකන්දිකාවදානය**

මාකන්දිකාවදානය හා ධම්මපදට්ඨකථාවේ දෙවැනි වග්ගයේ පළමු ගාථාවට අදාළ විස්තරය අතර කැපී පෙනෙන සමාන ලක්ෂණ රාශියක් හඳුනාගත හැකිය. උක්ත මූලාශ්‍රය දෙක අන්‍යෝන්‍ය වශයෙන් සංසන්දනය කිරීමේදී හඳුනාගත හැකි වෙනස්කම් වෙන වෙනම පහත දක්වනු ලැබේ.

- උදේන රජුට සිටි 'වාසුලදත්තා' නම් මෙහෙසියක් පිළිබඳ ධම්මපදට්ඨකථාවේ (මෙතැන් සිට 'අටුවාවේ' යනුවෙනි) කියවේ. එහෙත් මාකන්දිකාවදානයේ (මෙතැන් සිට 'අවදානයේ' යනුවෙනි) එවැනි චරිතයක් හමු නොවේ.

- අටුවාවේදී 'මාගන්දිය' නම් 'බමුණාගේ' දියණිය වූ 'මාගන්දියා' උදේන රජුගේ අගමෙහෙසියක වශයෙන් සිටි බව පැවසේ. ඇගේ මවද සුළු පියාද 'මාගන්දිය' නමින් හැඳින්වේ. එහෙත් අටුවාවේදී 'මාකන්දික' නම් 'පරිව්‍රාජකයාගේ' දියණිය

'අනුපමා' නම් වන අතර භාර්යාව 'සාකලී' නම් වේ. සුළු පියෙකු පිළිබඳ අවදානයේ සඳහන් නොවේ.

- අටුවාවේදී බුදුරදුන් බමුණු ගමේ ගිනි පුදන ස්ථානයට වඩින්නේ මාගන්දිය බමුණා සහ බැමිණිය අනාගාමී ඵලයට පැමිණීමට තරම් වාසනාවන්ත හෙයින් ඔවුන්ට ඒ සඳහා පිහිට වීමටයි. එහෙත් අවදානයේදී එවැන්නක් පිළිබඳ නොපැවසේ.
- අටුවාවේදී බුදුරදුන් දුටු විගස බමුණා 'ඔබ මාගේ දියණියට හොඳින්ම ගැළපෙන ස්වාමියාය. එනිසා ඇය රැගෙන එන තුරු මෙහිම රැඳී සිටින්න.' යනුවෙන් පවසයි. අවදානයේදී බුදුරදුන් දුටු විගස උන්වහන්සේ සමග කිසිදු කථාබහකින් තොරව මාකන්දික සිය දියණිය හා බිරිඳ රැගෙන ඒමට යයි.
- අටුවාවේදී මාගන්දිය සිය දියණිය හා බිරිඳ සමග බුදුන් වෙතට එළඹෙන බව දැනගත් නගර වැසියන් විශාල පිරිසක් ඔවුන් සමග බුදුරදුන් වෙතට එළඹේ. එහෙත් අවදානයේ එවැන්නක් සඳහන් නොවේ.
- අටුවාවේදී බුදුරදුන් විසින් සිය වීතරාගි බව පැහැදිලි කරමින් 'මලමූත්‍ර පිරුණු' මාගන්දියා ප්‍රතික්ෂේප කරනු ලැබේ. එමට සවන් දුන් මාගන්දිය යුවළ සෝවාන් වෙති. මාගන්දියා බුදුරදුන් කෙරෙහි වෛර බඳී. මාගන්දියාගේ (අනුපමාගේ) සිතේ බුදුන් පිළිබඳ හටගත් ද්වේෂය පිළිබඳ අවදානයේ දැක්වෙතත් ඇගේ දෙමව්පියන් සෝවාන් වීම පිළිබඳ සඳහන් නොවේ.
- අටුවාවේදී මාගන්දිය යුවළ සිය දියණිය චුල්ල මාගන්දිය හට භාරදී ඒ දෙදෙනා බුදුසසුනේ පැවිදි වී රහත් වූහ.
- බුදුරදුන් විසින් අනුපමා ප්‍රතික්ෂේප කළ පසු එක්තරා මහලු භික්ෂුවක් 'ඔබට අනුපමා එපා නම් මා හට ලබාදෙන්න' යැයි ඉල්ලා සිටීම හා බුදුරදුන් එය ප්‍රතික්ෂේප කළ හෙයින් මහල්ලා බුදුරදුන් අතහැර ගොස් අනුපමා තමන්ට දෙන්නැයි මාකන්දිකගෙන් ඉල්ලා සිටීම පිළිබඳ පුවතක් අවදානයේ සඳහන් වුවත් අටුවාවේ එවැන්නක් ඇතුළත් නොවේ.
- අටුවාවට අනුව චුල්ල මාගන්දිය විසින් මාගන්දියා තරුණිය කොසඹෑ නුවර උදේන රජුට පාවා දෙනු ලැබේ. එහෙත් අවදානයේදී රජුට අනුපමා පිළිබඳ දැනගන්නට ලැබෙන්නේ අහම්බෙනි. පසුව රජු අනුපමා අගමෙහෙසිය බවට පත්කර ගනී; මාගන්දිකට අගමැති තනතුරක් පිරිනමයි.
- අටුවාවේදී ඛුජ්ජුත්තරා දාසිය හා සාමාවතී අගබිසව අතර ඇති සම්බන්ධතාව කෙබඳුදැයි පැහැදිලි කරන නමුත් අවදානයේදී කුබ්ජෝත්තරා පිළිබඳ විශේෂ හැඳින්වීමක් නොමැත.
- අටුවාවේදී බුදුරදුන්ගෙන් පළි ගැනීමට මාගන්දියා විවිධ උපක්‍රම යොදන අතර සාමාවතීද එහි ගොදුරක් බවට පත්වෙයි. අවදානයේදී රජුගේ සිත ශ්‍යාමාවතී කෙරෙහි බිඳවීමට අනුපමා විවිධ උපක්‍රම යොදයි. ඒ අතර,

බුදුරදුන් ඇතුළු සඟ පිරිස දැකීමේ අදහසින් කාන්තාවන් විසින් ඇතොවුරේ බිත්තිවල සාදා තිබූ සිදුරු පරපුරුෂයන් දෙස බැලීමට තැනූ ඒවා වශයෙන් මාගන්දියා රජුට හුවා දැක්වීම හා අවසානයේ එහි සත්‍ය තොරතුරු රජු දැනගැනීම සම්බන්ධ විස්තරය අටුවාවේ සඳහන් වුවත් අවදානයේ එවැන්නක් නොමැත.

අටුවාවේදී හා අවදානයේදී මාගන්දියා/අනුපමා කුරුල්ලන්/කුකුළන් යොදාගෙන සාමාවතී/ශ්‍යාමාවතී නැසීමට ගත් උපක්‍රමයට සම්බන්ධ සිදුවීම සංසන්දනය කළ හැකිය.

මේ පිළිබඳ අටුවාවේ සඳහන් වන ආකාරය පහත දැක්වේ.

මිය ගිය 'කුකුළන්' අට දෙනෙකු හා පණ ඇති 'කුකුළන්' අට දෙනෙකු රැගෙන එන ලෙසත් එයින් පණ ඇති කුකුළන් අට දෙනා පළමුවත් මිය ගිය කුකුළන් අටදෙනා දෙවැනිවත් ගෙන එන ලෙස මාගන්දියා විසින් චුල්ල මාගන්දියට (සුළු පියාට) දන්වයි. ඔහුද එසේ කරයි. රජු වෙත රැගෙන ආ පණ ඇති කුකුළන් අටදෙනා මරා පිසීමට සාමාවතී ප්‍රමුඛ ස්ත්‍රීන් වෙත යවන ලෙස මාගන්දියා රජුට යෝජනා කරයි. ඒ අනුව රජුද 'වෙන කෙනෙකුට නොදී මේ කුකුළන් තමන්ම මරා පිස ගෙන එන්න' යැයි සාමාවතී හට පණිවුඩ යවයි. සේවකයකු විසින් එම කුකුළන් රැගෙන ගිය විට තමන් ප්‍රාණඝාතනය නොකරන හෙයින් සාමාවතී රජුගේ නියෝගය ඉටු කිරීම ප්‍රතික්ෂේප කරයි. ඉන්පසු මාගන්දිය රජුට පවසන්නේ එම කුකුළන් මරා පිස ශ්‍රමණ භවත් ගෞතමයන්ට යවන්නැයි සාමාවතීට දන්වන ලෙසසි. ඒ අතරතුර මාගන්දියා රහසිගතවම මිය ගිය කුකුළන් අට දෙනා සේවකයෙකු අත සාමාවතී වෙත යවන අතර සාමාවතී ඇතුළු පිරිස එය කැමැත්තෙන් භාරගනී. අදාළ සේවකයා රජුට මේ බව දැනුම් දුන් අතර රජු එයින් සාමාවතී පිළිබඳ කෝපයට පත්වෙයි. මාගන්දියාද සාමාවතී පිළිබඳ රජුගේ කළකිරීම වර්ධනය කිරීමට විවිධ දේවල් පවසයි. එහෙත් අවසානයේ රජු සාමාවතී ඇතුළු පිරිසට කිසිදු දඬුවමක් නොකරයි.

මෙය අවදානයේ සඳහන් වන ආකාරය පහත දැක්වේ.

ශ්‍යාමාවතී විසින් රජුට භෝජන පිළියෙල කරන දිනයක රාත්‍රී භෝජනය සඳහා කපිංජල පක්ෂීන් කිහිප දෙනෙකු පණ පිටින් ගෙනෙන්නැයි රජු කුරුලු වැද්දෙකුට අණ කළ අතර එය පිළියෙල කිරීමට අනුපමාට පවසයි. නමුත් අනුපමා පවසන්නේ එදින ආහාර පිළියෙල කිරීම නියමිතව ඇත්තේ ශ්‍යාමාවතී ඇතුළු පිරිසට බවයි. ඒ අනුව රජු එම සජීවි පක්ෂීන් ශ්‍යාමාවතී වෙත යවයි. එහෙත් තමන් ප්‍රාණඝාතනය නොකර හෙයින් එය පිළියෙල කිරීමට නොහැකි බව ශ්‍යාමාවතී පවසයි. පෙරළා රජු වෙත පැමිණි ශාකුනිකයා ශ්‍යාමාවතීගේ ප්‍රතිචාරය රජුට පවසන අතර එය අසා සිටි අනුපමා රජුට පවසන්නේ ශ්‍රමණ භවත් ගෞතමයන්ට පිළිගැන්වීමට පිසින්නැයි මේ සජීවි කපිංජල පක්ෂීන් ශ්‍යාමාවතී වෙත නැවත යවන ලෙසයි. රජුද එසේ කරයි. ශාකුනිකයා

විසින් ශ්‍යාමාවතී වෙත එම සජීවී පක්ෂීන් රැගෙන යද්දී රහසේම අතර මගට පැමිණි අනුපමා අතරමගදී එම පක්ෂීන් මරා ශ්‍යාමාවතී වෙත රැගෙන යන ලෙස ශාකුනිකට පවසයි. ඔහුද එසේ කරන අතර ශ්‍යාමාවතී මළ පක්ෂීන් පිසීමට භාරගනී. මේ බව ඇසූ උදේන රජු අනුපමාගේද පෙළඹවීම මත දුනු ඊතල රැගෙන ශ්‍යාමාවතී ඇතුළු පිරිස නැසීමට යයි. මේ පිළිබඳ දැනගත් ශ්‍යාමාවතී මෛත්‍රී වඩන ලෙස සිය පිරිවරට උපදෙස් දෙයි. ඔවුහුද එසේ කරති. රජු බොහෝ වැර ගෙන ශ්‍යාමාවතී ඇතුළු පිරිස නැසීමට ඊතල විද්දද ඒ කිසිවකින් ශ්‍යාමාවතී ඇතුළු පිරිසේ සිටි කිසිවෙකුටත් හානියක් නොවීය.

- අටුවාවේදී මාගන්දියා විසින් සුළු පියා සමග එක්ව රජුගේ හස්තිකාන්ත මාණික්‍යය තුළට සර්පයෙකු දමා එය රජු නැසීමට ශ්‍යාමාවතී කළ උපක්‍රමයක් යැයි හුවා දැක්වීම සම්බන්ධ සිදුවීම අවදානයේ ඇතුළත් නොවේ.

- අටුවාවේදී සාමාවතී පිළිබඳ පැහැදුණු උදේන රජු ඇයට වරයක් දුන් අතර එය පසුව ගන්නෙමියි ඇය පවසයි. අවසානයේදී වරය වෙනුවෙන් ඇය ඉල්ලා සිටින්නේ පන්සියයක් භික්ෂූන් සමග බුදුන් වහන්සේ සිය ප්‍රාසාදයට වඩමවා ගැනීමට අවසර ලබාදෙන ලෙසයි. අවදානයේදී ශ්‍යාමාවතී පිළිබඳ පැහැදුණු උදේන රජු ඇයට වරයක් දෙයි. වරය වශයෙන් ඇය ඉල්ලා සිටින්නේ රජු අන්තඃපුරයට පිවිසෙන විට ඇයට ධර්මාන්වය පිහිටුවා ගැනීමට අවස්ථාව දෙන ලෙසයි. රජු එය පිළිගනී.

- අටුවාවේ සඳහන් වන, සාමාවතී ඇතුළු පන්සියයක් දෙනාට දහම් දෙසීමට රජු විසින් බුදුරදුන්ට ආරාධනා කිරීම, බුදුරදුන් විසින් ඒ සඳහා ආනන්ද හිමියන් යොමු කිරීම, ආනන්ද හිමි ඇතුළු පන්සියයක් භික්ෂූන්ට උදේන රජු විසින් සළු පිළිගැන්වීම යන සිදුවීම් අවදානයේ හමු නොවේ.

- අටුවාවේදී සාමාවතී නැසීමට තමන් යෙදූ සියලු උපක්‍රම ව්‍යර්ථ වීම හේතුවෙන් සාමාවතීගේ ප්‍රාසාදය ගිනි තබා විනාශ කිරීමට උපක්‍රමයක් යොදා සුළු පියා එයට යොමු කරවයි. ඇය ඒ බව පියාට හසුනකින් දැනුම් දෙන්නේ රජු සමග උයන් කෙළියට යන අතරමගදීය. අවදානයේදී 'මේ රජු මා සමග රති ක්‍රීඩා කරයි. නව ඵලවලින් හා නව සස්‍යවලින් ශ්‍යාමාවතීට සත්කාර කරයි. එහෙයින් මැය නැසීමට උපක්‍රමයක් යෙදිය යුතුය' යැයි අනුපමා සිතයි.

- අවදානයේ සඳහන් වන රජතුමා ප්‍රාදේශීය කෝලාහලයක් සංසිඳවීමට සේනාව සමග පිටත් වීම පිළිබඳ පුවත අටුවාවේ නොමැත.

- අටුවාවට අනුව සාමාවතීගේ ප්‍රාසාදය ගිනි තබා විනාශ කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කරන ලෙස මාගන්දියා විසින් රජු උයන් කෙළියට යද්දී සුළුපියාට ලිපියක් මගින් දැනුම් දෙයි. අවදානයේදී ශ්‍යාමාවතී ඇතුළු පන්සියයක් පිරිස නැසීමට අවස්ථාවක් බලමින් සිටි අනුපමා කෝලාහලය සන්සිඳවීමට රජු පිටත් වූ පසු සිය පියා (මාකන්දික) කැඳවා ශ්‍යාමාවතී නසන ලෙස පවසයි. එහෙත් මාකන්දික එයට විරුද්ධ වෙයි. අනතුරුව, යම් හෙයකින් එය නොකරන්නේ නම්

ඔහුගේ අගමැති තනතුර අහිමි කර නැවත පැරණි තත්ත්වයට පත්කරන බවට තර්ජනය කරයි. එහෙයින් අවසානයේදී මාකන්දික අනුපමාගේ යෝජනාවට එකඟ වෙයි. ඒ අනුව ශ්‍යාමාවතී ප්‍රමුඛ පිරිස රාත්‍රියෙහි පහන් එළියෙන් බුද්ධ වචන උගනිති. එහෙයින් ඔවුන්ට තල්පත්, තෙල්, තීන්ත ආදියෙන් ප්‍රයෝජන ඇත. ඒ අනුව එකී දේවල් රාශියක් රැගෙනවිත් ශ්‍යාමාවතීගේ ප්‍රාසාදයේ තබා ඊයක ආධාරයෙන් ඊට ගිනි තබයි.

අටුවාවේදී මාගන්දියාගේ සුළු පියා තෙල් ගැල්වූ රෙදිවලින් සාමාවතීගේ ප්‍රාසාදයේ කණු වෙළයි. ඒ කුමක් සඳහාදැයි සාමාවතී විමසූ විට ඔහු පවසන්නේ කණු ශක්තිමත් කිරීමට එසේ කරන බවයි. තවද, ඔහු වෙතින් ඉවතට යන ලෙස සාමාවතී ඇතුළු පිරිසට පවසයි. අනතුරුව, සාමාවතී ඇතුළු පිරිස ගෘහය ඇතුළට යවා දොරවල් වසා ප්‍රාසාදයට ගිනි තැබීය.

- අවදානයේදී පහය ගිනි ගන්නා විට ශ්‍යාමාවතී සෘද්ධියෙන් ආකාශයට නැගී අප විසින්ම මේ කර්ම රැස් කළේ යැයිද කර්ම කිසි කලෙකත් මග හැරිය නොහැකි යැයිද බුද්ධ භාෂිතයක්ද ඇසුරු කරගනිමින් සිය පිරිවරට පැහැදිලි කර දෙයි. අටුවාවේදී අනන්ත සසර ගමනෙහි අපමණ වාර ගණනක් මෙසේ තැවුණු බවත් එහෙයින් පමා නොවන ලෙසත් පිරිවර ස්ත්‍රීන්ට උපදෙස් දෙයි. ගින්නෙන් දැවෙන විට වේදනා පරිග්‍රහ වැඩීම හේතුවෙන් මොවුන් විවිධ ඵලවලට පත් වූ බව අටුවාවේ සඳහන් වේ.

- අවදානයේදී භික්‍ෂූන් හමුවේ බුදුරදුන් පැහැදිලි කරන්නේ එම පිරිසෙහි සිටි කිසිවෙක් දුගතියට නොගිය අතර සෝවාන්, සකෘදාගාමි, අනාගාමි යනුවෙන් සංයෝජන විවිධ ප්‍රමාණවලින් නැසූ අයගේ පටන් සුගතිගාමී වීමට හේතු වන විවිධ පින්කම් කළ අය එහි සිටි බවයි. අටුවාවේදී බුදුරදුන් පැහැදිලි කරන්නේ ඔවුන් අතර, සෝවාන්, සකදාගාමි, අනාගාමි යන ඵලවලට පත් වූ අයද සිටි අතර ඔවුන් නිකරුණේ කළුරිය නොකළ බවයි.

- අවදානයේදී 'අප්‍රියාඛ්‍යායින්' හරහා උපක්‍රමයක් මගින් ශ්‍යාමාවතී ඇතුළු කාන්තාවන් ගින්නකින් මිය ගිය බව ප්‍රාදේශීය කෝලාහලයක් පාලනය කිරීමෙහි නිරතව සිටි රජුට දන්වන අතර එය ඇසූ රජු සිහි මුළා වී පතිත වෙයි. පසුව දිය ඉසීමෙන් සිහි එළවාගැනීමෙන් අනතුරුව සිව්රඟ සෙනග සමග මාළිගාව බලා පිටත් වෙයි. පුරවැසියන් ගින්න සම්බන්ධ සියලු විස්තර රජුට පවසන අතර මාකන්දික - අනුපමා දෙදෙනා යන්ත්‍රගෘහයේ දමා දවන ලෙස යෝගන්ධරායණට නියම කරයි. පසුව හෙතෙම ඒ දෙදෙනාව භූමිගෘහයේ සඟවන අතර සතියකින් පමණ පසුව රජු අනුපමා පිළිබඳ විමසයි. පසුව ඇය යෝගන්ධරායණ විසින් රජු වෙත පමුණුවනු ලැබේ. අටුවාවට අනුව ගින්න පිළිබඳ ආරංචි වී රජු ඇතුළු පිරිස එහි පැමිණියත් ගින්න නිවීමට නොහැකි විය. පසුව රජු විසින් මෙම ක්‍රියාව සිදුකළේ මාගන්දියා ඇතුළු ඇගේ ඥාතීන් විසින් බව මාගන්දියාගේ මුවින්ම උපක්‍රමශීලීව දැනගෙන ඒ සැමට උපහාර

දැක්වීමේ මුවාවෙන් මාළිගයට කැඳවා විවිධ වධහිංසා පමුණුවා ඝාතනය කරන ලදි.

- මීට අමතරව, සාමාවතී/ශ්‍යාමාවතී ඇතුළු කතුන් ගින්නකින් මරණයට පත්වීමට හේතුව පැහැදිලි කරමින් බුදුරදුන් දේශනා කරන අතීත කථාව අටුවාවේදීත් අවදානයේදීත් වෙනස් වන්නේ සුළු වශයෙනි. මූලාශ්‍රය දෙකේම මේ සම්බන්ධ මූලික තොරතුරු බොහෝ දුරට සමානය. එසේම, ඛුජ්ජුත්තරාගේ/කුබ්ජෝත්තරාගේ කුදුබවට හේතු වූ අතීත කථාවත් ඇය ශ්‍රැතධර වීමට හේතුවත් දාසියක වීමට හේතුවත් පැහැදිලි කර අතීත කථා සංසන්දය කර බැලීමේදී බොහෝ සමාන ලක්ෂණ ඇති අතර තේමාවන් අතින් සැලකිය යුතු වෙනස්කම් නොමැත.

## 06.04. බෘහත්කථාව (කථාසරිත්සාගරය)[32] හා මාකන්දිකාවදානය

උදයන - වාසවදත්තා යුවළ පිළිබඳ විස්තර කෙරෙන සංස්කෘත සාහිත්‍යයික මූලාශ්‍රයන් අතර බෘහත්කථාව සුවිශේෂී මූලාශ්‍රයක් වශයෙන් හඳුනාගත හැකි වන්නේ එය නාට්‍ය රචනා ගණනාවකටම වස්තුවිෂය සම්පාදනය කර තිබෙන හෙයිනි. මාකන්දිකාවදානයේද සැලකිය යුතු කොටසක් උදයන රජු මත පදනම් වන අතර මූලාශ්‍රය දෙක අතර වෙනස්කම් කිහිපයක්ම හඳුනාගත හැකිය. අවදානයේදී උදයන රජු පිළිබඳ පළමුවෙන්ම සඳහන් වන්නේ අනුපමා - මාකන්දික දෙදෙනා කෞශම්බියට යෑමෙන් අනතුරුවයි. අනුපමා ආවාහ කර ගැනීමේ පටන් ශ්‍යාමාවතී ගින්නෙන් විනාශ වීම දක්වා කොටස තුළ උදයන රාජ චරිතය හමුවේ. මෙම මූලාශ්‍රය දෙක අතර ඇති වෙනස්කම් හඳුනා ගැනීම මෙහිදී වැදගත් වේ.

- බෘහත්කථාවේ අනුපමා, ශ්‍යාමාවතී යනුවෙන් අගමෙහෙසියන් දෙදෙනෙකු පිළිබඳ සඳහන් නොවන අතර උදයන - වාසවදත්තා පිළිබඳ පමණක් සඳහන් වේ.

- අනුපමා - ශ්‍යාමාවතී දෙදෙනාගෙන් ශ්‍යාමාවතීගේ චරිතය වාසවදත්තාගේ චරිතයේ ලක්ෂණවලට යම් පමණකින් සමානය.

- බෘහත්කථාවේ සඳහන් වන අගමැති යෞගන්ධරායණ, ඇමති රුමණ්වත් හා වසන්තක යන තිදෙනා වෙනුවට අවදානයේදී හමු වන්නේ යෞගන්ධරායණ අගමැතිවරයාය. හෙතෙම බෘහත්කථාවේ තරම් අවදානයේ සජීවි චරිතයක් නොවේ. එහෙත් බෘහත්කථාවේ සඳහන් අගමැති යෞගන්ධරායණයේ චරිතයේ ඇතැම් ලක්ෂණ අවදානයේදී හමුවන අගමැති යෞගන්ධරායණගේ චරිතයට යම් පමණකට සමාන ලක්ෂණ දරයි.

- බෘහත්කථාවේ වත්ස රාජ උදයනගේ පාලන ප්‍රදේශය පුළුල් කර ගැනීමේ අරමුණ ඇතිව මගධ රටේ ප්‍රද්‍යොත රජුගේ රාජ්‍යය 'සාමකාමීව' අල්ලා ගැනීමට සුදුසු දේශපාලන උපක්‍රමයක් වශයෙන් යෞගන්ධරායණ - රුමණ්වත් කල්පනා

කරන්නේ මගධ රජුගේ දියණිය වූ පද්මාවතී කුමරිය උදයන රජුට ආවාහ කර දීමයි. එහෙත් උදයන රජු දැනටමත් වාසවදත්තාව ආවාහ කරගෙන ඇති බැවින් මගධ රජු එයට අකැමැති වන හෙයින් වාසවදත්තා දේවිය ගින්නකින් මියගිය බව ප්‍රසිද්ධ කර අනතුරුව මගධ රජුගේ කැමැත්ත ඇතිව පද්මාවතී උදයන රජුට සරණපාවා දීමට යෞගන්ධරායණ - රුමණ්වාන් සැලසුම් කළහ. මේ පිළිබඳ වාසවදත්තාට පැහැදිලි කර ඇගේ අනුමැතියද ලබාගන්නා ලදී. ඒ අනුව, පෙර සැලසුම් කරගත් පරිදි මගධ රටට ආසන්නයේ පිහිටි ලාවාණක නම් ප්‍රදේශයට උදයන - වාසවදත්තා දෙදෙනා රැගෙන යන අතර එහිදී රජු දඩයමේ ගිය අවස්ථාවේදී වාසවදත්තාව බ්‍රාහ්මණ තරුණියක ලෙස වෙස් ගන්වා වසන්තක හා යෞගන්ධරායණ විසින් මගධ රජුගේ දියණිය වූ පද්මාවතී වෙත උපක්‍රමශීලීව යොමු කරයි. ඒ අතර රුමණ්වත් විසින් වාසවදත්තාගේ නිවසට ගිනි තබා ඇය ගින්නකින් මිය ගිය බව ප්‍රචාරය කෙරේ. දඩයම හමාර කර පැමිණි රජු වාසවදත්තා ගින්නකින් විනාශ වූ බව දැනගෙන අතිශයින් දුකට පත්වේ; බිම පතිත වේ; සිහි මුළාවේ. එහෙත් පසුව වාසවදත්තාට ඉතා ප්‍රබල පුතෙකු ලැබෙන බවට නාරද ඍෂිවරයා විසින් පැවසූ අනාවැකිය නොවරදින හෙයින්ද යෞගන්ධරායණ හා අනෙකුත් ඇමතිවරුන් වාසවදත්තාගේ අකල් මරණය හේතුවෙන් බලවත් ශෝකයකින් සිටින බව නොපෙනෙන හෙයින්ද වාසවදත්තා ජීවතුන් අතර ඇති බව අනුමාන කරන උදයන රජු සිතන්නේ මෙය ඇමතිවරුන්ගේ දේශපාලනික උපක්‍රමයක් බවත් නැවතත් දිනයක වාසවදත්තා සමග එක්වීමට තමන්ට අවස්ථාවක් ලැබෙන බවත්ය.

- බෘහත්කථාවේ මෙන් අවදානයේ පෙර කී ආකාරයේ දේශපාලන පසුබිමක් නොමැති නමුත් උදයන රජුගේ දේවිය (ශ්‍යාමාවතී) ප්‍රාසාදයේ ගින්නකින් විනාශ වූ බවත් ඉන් අනතුරුව රජු පත් වූ අතිශය දුඃඛිත ඉරණමත් මූලාශ්‍රය දෙකේම විවිධ වෙනස්කම් සහිතව ඉදිරිපත් කෙරේ. බෘහත්කථාවේදී වාසවදත්තා සිටි ගෘහයට ගිනි තබා ඇය ගින්නෙන් මිය ගිය බව ඇඟවීමට අගමැති හා ඇමති සැලසුම් කරද්දී අවදානයේදී ශ්‍යාමාවතීගේ ප්‍රාසාදයට ගිනි තැබීමට අගමැති මාකන්දික සැලසුම් කර එය ක්‍රියාත්මක කරයි. බෘහත්කථාවේදී ප්‍රාසාදය ගිනිගෙන වාසවදත්තා මිය ගිය බව ප්‍රචාරය කරන්නේ උදයන රජු දඩයමේ ගිය විටයි. අවදානයේදී ශ්‍යාමාවතීගේ ප්‍රාසාදයට ගිනි තබන්නේ රජු ප්‍රාදේශීය කලහයක් සංසිඳවීමට ගිය විටයි. බෘහත්කථාවේදී වාසවදත්තා පද්මාවතීගේ නිවසේ සඟවා තබයි. අවදානයේදී අනුපමා (මාකන්දිකත් සමග) යන්ත්‍ර ගෘහයේ දමා දවන උදයන රජු නියෝග කළ විට යෝගන්ධරායණ අගමැතිවරයා ඇයව භූමිගෘහයේ සඟවයි. බෘහත්කථාවේදී, සිය අරමුණ සඵල වූ විට උදයන - වාසවදත්තා නැවත එකතු වෙයි. අවදානයේදී, භූමිගෘහයේ සඟවා තබන ලද අනුපමා උදයන රජුගේ ඉල්ලීම මත නැවතත් රජු වෙතට පමුණුවයි. බෘහත්කථාවේදී නාරද ඍෂිවරයාගේ අනාවැකි ආදිය සිහි කර මෙය

ඇමතිවරුන්ගේ උපක්‍රමයක් යැයි උදයන රජු උපකල්පනය කළද අවදානයේ එවැන්නක් සඳහන් නොවේ.

## 07. සමාලෝචනය

අවදාන කථාවල ප්‍රධාන අන්තර්ගතයක් වන කර්ම සංකල්පය පැහැදිලි කිරීම මාකන්දිකාවදානයේදීද සිදුවේ. ඒ සඳහා කර්මය හා කර්ම ඵලය අතර ඇති ඒකාබද්ධතාව පැහැදිලි කෙරෙන කථා කිහිපයක්ම එම අවදානයට ඇතුළත් කර තිබේ. සාහිත්‍ය මූලාශ්‍රයක් වශයෙන් සලකා බැලූ විට මෙම අවදානය වැදගත් වන්නේ බෞද්ධ හා බෞද්ධ නොවන මූලාශ්‍රයන් කිහිපයකටම මෙහි ඇති සම්බන්ධතාව නිසා යි. ඒ අතින් සලකා බැලූ විට විවිධ මූලාශ්‍රයවලට සම්බන්ධ තොරතුරු එකිනෙකට ගළපා සංග්‍රහ කරන ලද ස්වරූපයක් මාකන්දිකාවදානයෙන් හමුවන අතර අවදානය සැලකිල්ලෙන් කියවීමේදී ඒ බව අපහසුවකින් තොරව හඳුනාගත හැකිය. විශේෂයෙන්ම මූලසර්වාස්තිවාද විනය හා මෙම අවදානය අතර ඇති සම්බන්ධය පිළිබඳ වියතුන්ගේ අවධානය යොමු වී ඇත. ඒ හැරුණු විට මාකන්දිකාවදානයෙන් නිරූපණය වන සමාජය හා එහි භාවිත භාෂාව තවදුරටත් අධ්‍යයනය කළ යුතු අංශ වශයෙන් හඳුනාගත හැකිය.

*. මෙම ලේඛනයේ සෝදුපත් පරීක්ෂා කර ඉතා වටිනා සංශෝධන යෝජනා කළ ආචාර්ය නේපාලයේ සංකිච්ච හිමියන්ටත් ආචාර්ය ජම්බුගහපිටියේ ධම්මාලෝක හිමියන්ටත් මූලාශ්‍ර අර්ථකථනය කර ගැනීමේදී උපකාර කළ ශාස්ත්‍රපති අටබාගේ සෝමාලංකාර හිමියන්ට හා ඇතැම් ඉතා වැදගත් මූලාශ්‍රයන් සොයා ගැනීමේදී උපකාර කළ ශාස්ත්‍රවේදී මීගොඩ පඤ්ඤාරතන හිමියන්ට කෘතඥ වෙමි.

## ආන්තික සටහන්

1 "බුද්ධෝ භගවාන් කුරුෂු ජනපදචාරිකං චරන් කල්මාෂදම්‍යනුප්‍රාප්තඃ තෙන බලු සමයෙන කල්මාෂදම්‍යෙ මාකන්දිකො නාම පරිව්‍රාජකඃ ප්‍රතිවසති...."

2 බුදුරදුන් තමන්ට 'මුත්‍රපුරීෂවාදයෙන්' ඇමතීම හේතුවෙන් බුදුන් පිළිබඳ අනුපමාගේ සිතේ උපන් කෝපය මෙයට ප්‍රධාන හේතුව වන්නට ඇත.

3 තෙල් හෝ වෙනත් ඕනෑම නිෂ්පාදනය කරන ස්ථානයක් වශයෙන් සඳහන් වන නමුත් මෙහිදී 'වධක කුටිය' යන අර්ථයෙන් යොදා ඇත. (A Torture Chamber)

4 පොළොව යට තනන ලද කුටීරයක් මෙයින් අදහස් කෙරේ. (An Underground Chamber)

5 දිව්‍යාවදානයේ අවදාන කථා අවසන් කර ඇති ආකාර කිහිපයක් හඳුනාගත හැකිය. ඒ අනුව, අවදානය අවසානයේ සඳහන් කළ කිසියම් කථාවක පූර්වාපර සන්ධි ගැළපීම, එසේ පූර්වාපර සන්ධි ගැළපීමෙන් අනතුරුව කර්මය පිළිබඳ බුදුරදුන් විසින් භික්ෂූන්ට පැහැදිලි කර 'භික්ෂූනි, තෙපි මෙසේ හික්මිය යුතුය' යන උපදේශය සමග අවසන් කිරීම, බුදුරදුන්ගේ ධර්මදේශනාවක් අවසානයේ ඒ පිළිබඳ පැහැදුණු ශ්‍රාවකයෙකු විසින් කරන ප්‍රීතිය ප්‍රමුඛ ප්‍රශංසා වාක්‍යයකින් අවදානය අවසන් කිරීම, එවැනි කිසිදු ලක්ෂණයකින් තොරව අවදානය අවසන් කිරීම, පද්‍යයකින් අවසන් කිරීම යනු ඉන් සමහරකි.

6 Clark, C. 2011. "Karma and Karmavipāka in the Early Buddhist Avadāna Literature". In: *Journal of the Oriental Society of Australia*, Vol. 43, p. 24.

7 "භගින්‍යඃ, අස්මාභිරෙවෛතානි කර්මාණි කෘතාන්‍යුපචිතානි ලබ්ධසංභාරාණි පරිණතප්‍රත්‍යයාන්‍යෝඝවත්ප්‍රත්‍යුපස්ථිතාන්‍යවශ්‍යංභාවීනි. අස්මාභිරෙව කෘතාන්‍යුපචිතානි. කෝ'න්‍යඃ ප්‍රත්‍යනුභවිෂ්‍යති?"

8 "ආභිරෙව මහාරාජ කර්මාණි කෘතාන්‍යුපචිතානි ලබ්ධසංභාරාණි පරිණතප්‍රත්‍යයානි පූර්ව්වද්‍යාවත්ඵලන්ති බලූ දෙහිනාම්"

9 "...යදාභිඃ ප්‍රත්‍යෙකබුද්ධස්‍ය කුටිකාං දග්ධ්වා අනුමොදිතම්, තස්‍ය කර්මණො විපාකෙන බහූනි වර්ෂාණි නරකෙෂු පත්තා යාවදෙතර්හ්‍යපි දෘෂ්ටසත්‍යා අග්නිනා දග්ධාඃ"

10 "...ඉති හි මහාරාජ එකාන්තකෘෂ්ණානාං කර්මාණාං පූර්ව්වද්‍යාවදෙවමාභොගඃ කරණීයඃ. ඉත්‍යෙවං තෙ මහාරාජ ශික්ෂිතව්‍යම්...."

11 මෙහි කිසියම් විශේෂ ලක්ෂණයක් දක්නට ලැබේ. එනම්, අදාළ කර්මය හා කර්ම විපාකය සඳහන් කතා පුවත ඉතා කෙටි වන අතර එහිදී වැඩි අවකාශයක් වෙන් කරන්නේ ශ්‍රීමතී සම්බන්ධ කතා පුවත ඉදිරිපත් කිරීමටයි. මේ පිළිබඳ ඉදිරියේදී තවදුරටත් සාකච්ඡා කෙරේ.

12 ශ්‍යාමාවතී ඇතුළු පිරිස ගින්නෙන් දැවීමට හේතු වූ කර්මය පැහැදිලි කරන අතීත කථාව අවසානයේදී පමණක් මෙම පියවර දක්නට ලැබේ.

13 Rotman, Andy (tr.). 2008. *Divine Stories (Divyāvadāna)* Part I. Boston: Wisdom Publications, p.23

14 Ibid.

15 එක්තරා අවස්ථාවක රජු වෙත පැමිණෙන 'ප්‍රියාඛ්‍යායින්' (ප්‍රිය දේ පවසන්නා) හා 'අප්‍රියාඛ්‍යායින්' (අප්‍රියා දේ පවසන්නා) යන දෙපලට උදයන රජු රජ මාලිගාවේ රැකියා ලබාදෙයි. ඒ අතරින් කථාවේදී නැවතත් හමුවන්නේ අප්‍රියාඛ්‍යායි පමණි. වෘත්තියෙන්ම හෙතෙම රජුට අප්‍රිය දේ පැවසීම රාජකාරිය වශයෙන් පැවරී ඇති හෙයින් ශ්‍යාමාවතී ඇතුළු පිරිස මිය ගිය බව රජුට දැනුම් දීම භාර වන්නේ මොහුටය. එහෙත් විශේෂත්වය වන්නේ එය රජුට සන්නිවේදනය කරන ආකාරයයි. එම සිදුවීමට අදාළ සියල්ල ඇමතියන් මගින් චිත්‍රයකට නගා උපක්‍රමශීලීව 'මළ කෙනෙක් නැවත කිසිවෙකුටත් රැගෙන ආ නොහැකි බව' රජුගේ මුවින්ම පැවසෙන්නට පසුබිම සලසා අනතුරුව චිත්‍රය විශ්ලේෂණය කරන මුවාවෙන් ශ්‍යාමාවතී ඇතුළු පිරිස මිය ගිය බව රජුගේ මුවෙන්ම පැවසෙන ආකාරයට උපක්‍රමශීලීව කටයුතු යොදයි. මෙම කොටස මාකන්දිකාවදානයේ ඇතුළත් කථා රසයෙන් අනූන වූවක් වශයෙන් හඳුනාගැනීමට තරම් ලක්ෂණ ඇතුළත් වේ.

16 මෙය 'and so no as before, up to' යනුවෙන් Sathoshi විසින් ඉංග්‍රීසියට පරිවර්තනය කර ඇත. මෙහි සිංහල අර්ථය "පෙර දැක්වූ / පෙර සඳහන් කළ" යනුවෙනි.

17 Hiraoka, S. 1998. "The Relationship between the Divyāvadāna and the Mūlasarvāstivāda Vinaya". In: *Journal of Indian Philosophy,* pp. 426-427.

18 මෙය අවස්ථා තුනක ඉතා සුළු වෙනස්කම් සහිතව ආකාර තුනකින් දක්වා තිබේ. සසඳන්න.

ප්‍රථම අවස්ථාව "...අහං තාම්‍රද්වීපස්‍ය රාඥො දුහිතා. තෙනාහං සිංහලසාර්ථවාහස්‍ය භාර්යාර්ථං දත්තා. තස්‍ය මහාසමුද්‍රමධ්‍යගතස්‍ය මකරෙණ මත්ස්‍යජාතෙන යානපාත්‍රං භග්නම්. තෙනාහමම්බිගලෙති කෘත්වා ඡොරිතා. තදර්හසි තං මමොපසංවරයිතුමිති." (අවධාරණය මවිසිනි.)

ද්විතීය අවස්ථාව "...අහං තාම්‍රද්වීපරාජස්‍ය දුහිතා සිංහලසාර්ථවාහස්‍ය භාර්යාර්ථං දත්තා. මහාසමුද්‍රමධ්‍යගතස්‍ය සාර්ථවාහස්‍ය මත්ස්‍යජාතෙන යානපාත්‍රං භග්නම්. තෙනාහමම්බිගලෙති කෘත්වා අස්ථානෙ ඡොරිතා, කථඤ්චිදිහ සම්ප්‍රාප්තා. කෂුද්‍රපුත්‍රාහම්. අර්හථ සිංහලං සාර්ථවාහං ක්‍ෂමයිතුමිති." (අවධාරණය මවිසිනි.)

තෘතීය අවස්ථාව "...අහං තාම්‍රද්වීපස්‍ය රාඥො දුහිතා සිංහලස්‍ය සාර්ථවාහස්‍ය භාර්යාර්ථං දත්තා. තස්‍ය මහාසමුද්‍රමධ්‍යගතස්‍ය මකරෙණ මත්ස්‍යජාතෙන යානපාත්‍රං භග්නම්. තෙනාහමම්බිගලෙති ශ්‍රුත්වා අස්ථානෙ ඡොරිතා, කථඤ්චිදිහ සම්ප්‍රාප්තා. කෂුද්‍රපුත්‍රාහම්. තදර්හසි දෙව තමෙව සිංහලං සාර්ථවාහං ක්‍ෂමයිතුමර්හසි." (අවධාරණය මවිසිනි.)

19 "... සා පරමභීෂණරූපමභිනිර්මාය ලසුලස්වෙව ගත්වා සිංහලස්‍ය සාර්ථවාහස්‍ය පුරතො ගත්වා ස්ථිතා..." (ඡ බ ඪ්සාහ් ගේ දිව්‍යාවදාන සංස්කරණයට අනුව පිටු හා පේළි අංක යොදනු ලැබේ - 452.31,32), "... ස ත්වරිතත්වරිතං ඛඞ්ගමාදාය ගතඃ..." (454.10), "... සිංහලො රාජා චතුරඞ්ගාද්බලකායාද්වරවරවරාඞ්ගාන් හස්තිනො'ශ්වාන් ..." (454.25), "... න භූයො භූයඃ ප්‍රවෙශිතව්‍යම්..." (457.20) (අවධාරණය මවිසිනි.)

20 මෙවනි ආප්ත වාක්‍ය කිහිපයකදීම ස්ත්‍රිය සම්බන්ධයෙන් සඳහන් වන හෙයින් ස්ත්‍රිය පිළිබඳ අවදාන සම්පාදකයන්ගේ ආකල්පය ඉස්මතු වන අවස්ථාවක් වශයෙන් මෙය හඳුනාගත හැකිය.

21 තමන් සිංහල සාර්ථවාහකයාගේ භාර්යාව යැයිද තමන්ට සිදු වූ කරදර පිළිබඳවද පවසමින් ඔබ මොබ ඇවිදින රාක්ෂසිය පිළිබඳ දැනගත් සිංහලගේ දෙමව්පියන් පවසන්නේ ඇයව නිවසට කැඳවා ගෙන එන ලෙසයි. එහිදී ඇය මනුෂ්‍යයෙකු නොව, රකුසියකැයි සිංහල පැවසූ විට ඊට පිළිතුරු වශයෙන් ඔහුගේ දෙමව්පියන් විසින් මෙසේ පැවසේ.

22 කපිංජල පක්ෂීන් පිසීම පිළිබඳ සිදුවීමේදී අනුපමා විසින් රජු ශ්‍යාමාවතී පිළිබඳ කෝපයෙන් ඇයව විනාශ කිරීමට දුනු ඊතල රැගෙන පිටත් වීම පිළිබඳ පවසන අවස්ථාවේ අවදානයේ සම්පාදකයා විසින් පළකරන අදහසක් ලෙස මෙය සඳහන් වේ.

23 ශ්‍යාමාවතී පිළිබඳ රජුගේ සිතේ අප්‍රසාදය ඇති කිරීමට අනුපමා විසින් කළ සැලසුම් සියල්ල ව්‍යර්ථ වන අතර අවසානයේ රජු විසින් ශ්‍යාමාවතීය ධර්මාන්වය ලබාදෙනු ලැබේ. ඉන් ශ්‍යාමාවතීට රජුගෙන් ලැබෙන ඉමහත් සත්කාර කෙරෙහි අනුපමාගේ ඊර්ෂ්‍යාව වර්ධනය වූ අයුරු පැවසීමේදී අවදානයේ සම්පාදකයා විසින් පළ කරන අදහසක් ලෙස මෙසේ සඳහන් කර ඇත.

24 අප්‍රියාඛ්‍යායි හට රජ මාළිගාවේ වෘත්තියක් පිරිනමන අවස්ථාවේදී රජු විසින් ඇමතිවරුන්ට මෙය පැවසේ.

25 ශ්‍යාමාවතී නසන ලෙස අනුපමා විසින් මාකන්දිකට පැවසූ විට හෙතෙම එය ඉටු කිරීම ප්‍රතික්ෂේප කරයි. අනතුරුව තනතුරෙන් පහ කර නැවතත් පෙර සිටි තත්ත්වයට පත් කරන බවට තර්ජනය කළ පසු මාකන්දික මෙසේ සිතයි.

26 අමඞ්ගලෙ සාකලිකෙ ත්වං - මාඞ්ගල්‍යකාලෙ වදසෙ හ්‍යමඞ්ගලම්

සචෙද්දැත සමධිකෘතං භවිෂ්‍යති - පුනරප්‍යසෞ කාමගුණෙෂු රංස්‍යතෙ

27 "...උක්තඤ්ච භගවතා - නෛවාන්තරික්ෂෙ න සමුද්‍රමධ්‍යෙ න පර්වතානාං විවරං ප්‍රවිශ්‍ය

න විද්‍යතෙ ස පෘථිවිප්‍රදෙශො යත්‍ර ස්ථිතං න ප්‍රසහෙත කර්ම" මෙම පද්‍යය ධම්මපදයේ පාප වග්ගයේ එකොළොස්වැනි ගාථාව සමග සසඳන්න.

"න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ න පබ්බතානං විවරං පවිස්ස

න විජ්ජති සො ජගතිප්පදෙසො යත්ථට්ඨිතො මුඤ්චෙය්‍ය පාපකම්මා"

28 Hiraoka, p. 419

29 Rotman, p. 17

30 Hiraoka, p. 420

31 Hiraoka, p. 424

32 දැනට බෘහත්කථාව අවිද්‍යමාන වුවත් එය ඇසුරෙන් රචනා වූයේ යැයි සැලකෙන කථාසරිත්සාගරය මුල් කරගෙන මෙහිදී කරුණු දක්වනු ලැබේ.